RESEARCH ARTICLE
E-Journal of Social Work 2023 - 7 (1): 20-46

3

# Making sense of the Sri Lankan political power structure model and the elephant-human conflict dilemma through a conflictual theoretical approach

**ලාංකේය දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය හා අලි-මිනිස් ගැටුමේ උභතෝකෝටිකය ගැටුම්වාදී න්‍යායික ප්‍රවේශයක් තුළින් ඥානවිමංසනය කිරීම**

**Keerthi Jayawardane**
*Department of Sociology, University of Ruhuna, Matara, Sri Lanka.*

**Emeritus Professor Sarath Amarasinghe**
*Department of Sociology, University of Ruhuna, Matara, Sri Lanka*

**Professor N.V.G.A. Hemantha Kumara**
*Department of Sociology, University of Ruhuna, Matara, Sri Lanka*

**Abstract:** The elephant-human conflict was established as a well-known protracted social conflict in the society due to the introduction of modern large-scale development projects to develop rural infrastructure and not paying attention to the balancing factors of the natural environment. In particular, elephants' habitats and movement areas become human habitats, land parcels and clearing for commercial agriculture, invasion of their basic needs by human society can be identified as prominent issues of elephant-human conflict. Therefore, it can be confirmed that the conflict contains characteristics of homogeneity and heterogeneity and that the conflict has built the background necessary for socialization into a horizontal protracted social conflict. The main objective of the study is to identify the nature of the incomplete relationship between the political power structure model and elephant-human conflict. How the political power structure relationship has influenced the development of elephant-human conflict was used as the study problem. Mixed methodology was used under survey method for the study. A questionnaire was used to collect quantitative data and focus group discussions and retrospective studies were used to collect qualitative data. Stratified sampling was used under random sampling for the study and 50 respondents were selected in relation to the sample. Hambegamuwa and Hambegamuwa Colony Grama Niladhari Divisions belonging to Tanamalvila Divisional Secretariat Division of Monaragala District were used as the field of study. For this, two central and peripheral villages, which are different socially, economically and culturally, have been used for the study. Hambegamuwa was used as the central village while Hambegamuwa Colony used the peripheral village and Hambegamuwa was used as the central village because it was built from traditional residents. The migrated population resides in Hambegamuwa Colony and was used by the researcher as the peripheral village in the concept of resettlement. It can be revealed that the adaptation of the regional and rural political power structure model by the national political power structure model and the alignment of that adaptation with the peripheral and central factors of the conflict have provided the reasons for the development from a power political conflict to a protracted social conflict. Wildlife policies, sanctuary policies being at odds with the political system and the inter-relationship between inter-sectorial institutions and the non-operational and regulatory mechanism for this have become the reasons for the conflict to become a protracted social conflict. The conflict has created the characteristics of a protracted social conflict in the society based on the way the micro and macro political power structure process works. In particular, it was possible to find out how the political power structure model works in the rural level in the lease of land based on the new tax policy, becoming protected human habitations based on political goodwill. With the power

structure model, it can be revealed that the micro and macro political power structure has provided the background factors to create a conflicting relationship between the needs of the human and animal community by purchasing land by large-scale entrepreneurs and private businessmen, giving it to forest-protected business agriculture through gazettes. These dilemmas seem to have set the stage for the creation of a hetero-nationalization from a political homogenization. Especially when considering the macro and central issues of the conflict, it was possible to identify the collapse of the security mechanism, domestic violence, and early marriages as visible factors of the conflict. Domestic violence, psychological isolation and frustration due to the breakdown of the protection mechanism in the family can be identified as social factors. By paying attention to the situational factors of the conflict, the characteristics of a prolonged social conflict can be identified and the ups and downs of the conflict with seasonal times can be identified. It can be concluded that the conflict has turned into a protracted social conflict due to the mobilization of the political power structure model in the rural society and the mobilization to disrupt the welfare process in the human household and the spatial background necessary for the creation of a fed-up group in the rural environment. Therefore, rather than preventing the conflict, the necessary measures should be prepared to lead to a resolution process through mediation work.

**Key words:** **Elephant-human conflict, political power structure, protracted social conflict, large-scale development projects, homogenization**

**සාර සංක්ෂේපය**

නූතන මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ප්‍රවේශ වීමත් එම ප්‍රවේශගතකරණයේදී ස්වභාවික පරිසරයේ තුලනාත්මක සාදකයන් පිළිබඳ අවධානය යොමු නොකිරීමත් නිසා අලි- මිනිස් ගැටුම ප්‍රකට දික්ගැස්සුණු සමාජ ගැටුමක් ලෙස සමාජය තුළ ස්ථාපිත විය. විශේෂයෙන්ම අලින්ගේ වාසභූමි හා සංචරණ ප්‍රදේශ මානව වාසභූමි බවට පත්වීම, ව්‍යාපාරික කෘෂිකර්මාන්තය සඳහා ඉඩම් කට්ටි වීම හා එළිපෙහෙළි කිරීම නිසා ඔවුන්ගේ මූලික අවශ්‍යතා මානව සමාජය ආක්‍රමණය කිරීම අලි-මිනිස් ගැටුමේ ප්‍රකට කාරණයන් ලෙස හඳුනා ගත හැකිය. මේනිසා ගැටුම තුළ සහජාතිය හා විෂමජාතීය ලක්ෂණ අන්තර්ගත වීමත් එම ගැටුම තිරස් දික්ගැස්සුණු සමාජ ගැටුමක් බවට සමාජගත වීමට අවශ්‍ය සාධනිය පසුබිම ගොඩනංවා ඇති බව ද සනාථ කළ හැකිවේ. දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය හා අලි- මිනිස් ගැටුම අතර පවතින ඌන පූරක සම්බන්ධතාවයේ ස්වභාවය හඳුනා ගැනීම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වේ. දේශපාලන බල ව්‍යුහීය සම්බන්ධතාවය අලි-මිනිස් ගැටුම වර්ධනය වීම සඳහා බලපා ඇති ආකාරය කෙසේද යන්න අධ්‍යයන ගැටලුව ලෙස භාවිත කරන ලදී. අධ්‍යයනය සඳහා සමීක්ෂණ විධි ක්‍රමය යටතේ මිශ්‍ර ක්‍රමවේදය උපයෝගී කර ගන්නා ලදී. ප්‍රමාණාත්මක දත්ත ඒකරාශී කරගැනීම සඳහා ප්‍රශ්නමාලා උපලේඛනය භාවිතා කළ අතර ගුණාත්මක දත්ත ඒකරාශී කරගැනීම සඳහා නාභිය කණ්ඩායම් සාකච්ඡා, ප්‍රත්‍යයික අධ්‍යයන භාවිත කරන ලදී. අධ්‍යයනය සඳහා සසම්භාවී නියැදිය යටතේ ස්තෘත නියැදිය භාවිතා කළ අතර නියැදියට අදාළව ප්‍රතිචාරකයන් 50ක් තෝරා ගන්නා ලදී. අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙක උපයෝගී කරගන්නා ලදී. මේ සඳහා සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් එකිනෙකට වෙනස් කේන්ද්‍රීය හා පරිධිය ගම්මාන දෙකක් අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත. කේන්ද්‍රීය ගම්මානය ලෙස හම්බෙගමුවත් පරිධිය ගම්මානය හම්බෙගමුව ජනපදයත් උපයෝගී කරගත් අතර හම්බෙගමුව සාම්ප්‍රදායික පදිංචිකරුවන්ගෙන් ගොඩනැගී ඇති නිසා කේන්ද්‍රීය ගම්මානය ලෙස භාවිත විය. හම්බෙගමුව ජනපදය තුළ සංක්‍රමණය වූ ජනගහනය වාසය කරන අතර ඔවුන් නැවත පදිංචි කිරීම යන සංකල්පය තුළ පරිධිය ගම්මානය ලෙස පර්යේෂකයා විසින් භාවිත කරන ලදී. ප්‍රාදේශීය හා ග්‍රාමීය දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය ජාතික දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය මගින් පරිශිෂ්ටනය කිරීමත් එම පරිශිෂ්ටනය ගැටුමේ පරිධිය හා කේන්ද්‍රීය සාදක සමග අනුයාත කිරීම බල දේශපාලන ගැටුමක සිට දික්ගැස්සුණු සමාජ ගැටුමක් දක්වා වර්ධනය වීමට හේතු සාදක සපයා ඇති බව අනාවරණය කළ හැකිය. වනජීවී ප්‍රතිපත්ති, අභය භූමි ප්‍රතිපත්ති දේශපාලන ක්‍රමය සමග වෙනසියාවට ලක්වීමත් අන්තර් ආංශික ආයතන අතර අන්තර් සම්බන්ධතාවය බිඳවැටීමත් ඒ සඳහා මෙහෙයුම් හා නියාමන යාන්ත්‍රණයක් අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම නිසා ගැටුම දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත් වීමට හේතු සාධක වී තිබේ. ක්ෂුද්‍ර හා සාර්ව දේශපාලන බල ව්‍යුහීය ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ආකාරය මත ගැටුම සමාජය තුළ දික්ගැස්සුණු සමාජ ගැටුමක ලක්ෂණ නිර්මාණය කර ඇත. විශේෂයෙන්ම අනුනව බදු ප්‍රතිපත්තිය මත ඉඩම් බදු දීම, දේශපාලන හිතෛශීභාවය මත රක්ෂිත මානව වාසභූමි බවට පත්වීම තුළ දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය ග්‍රාමීය තලයෙහි ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගත හැකිවිය. බල ව්‍යුහීය ආකෘතිය සමග මහා පරිමාන ව්‍යවසායකයන් හා පෞද්ගලික ව්‍යාපාරිකයන් ඉඩම් මිලදී ගැනීම, ගැසට් මගින් වනරක්ෂිත ව්‍යාපාරික කෘෂිකර්මාන්තය සඳහා ලබාදීම මගින් ක්ෂුද්‍ර සහ සාර්ව දේශපාලන බල ව්‍යුහය මානව හා සත්ව ප්‍රජාවගේ අවශ්‍යතා අතර ඝට්ටණීය සම්බන්ධතාවයක් නිර්මාණය කිරීමට පසුබිම් සාධක සපයා ඇති බව අනාවරණය කළ හැකි වේ. මෙම උභතෝකෝටික කාරණා

දේශපාලන සහජාතීයකරණයක සිට විෂම ජාතීයකරණයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාදාමය සකස් කර ඇති බව පෙනේ. විශේෂයෙන්ම ගැටුමේ සාර්ව හා මධ්‍ය කාරණා පිළිබඳව සලකා බැලීමේ දී ආරක්ෂණ යාන්ත්‍රණය බිඳවැටීම, ගෘහස්ත හිංසනය, අඩු වයස් විවාහයන් ගැටුමේ දෘෂ් කෘත්‍ය සාදක ලෙස හඳුනා ගත හැකිවිය. ගෘහස්ත හිංසනය, කුටුම්බය තුළ ආරක්ෂණ යාන්ත්‍රණය බිඳවැටීම නිසා මානසික හුදකලාභාවය හා ඉච්ඡාභංගත්වයට පත් වීම සහජාතිය සමාජ සාධක ලෙස හඳුනා ගත හැකිය.ගැටුමෙහි තත්වාකාර සාදකයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දික්ගැස්සුණු සමාජ ගැටුමක ලක්ෂණ හඳුනා ගත හැකි අතර සෘතුමය කාලයන් සමග ගැටුමෙහි උත්පාත අවපාත තත්ත්වයන් හඳුනා ගත හැකිවේ. දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය ග්‍රාමීය සමාජය තුළ බලමුළුගැන්වීමත් එම බලමුළුගැන්වීම මානව කුටුම්බය තුළ සුබසාධන ක්‍රියාවලිය බිඳවැටීමටත් පරිපෝෂිත කණ්ඩායමක් ග්‍රාමීය පරිසරය තුළ නිර්මාණය වීමට අවශ්‍ය අවකාශීය පසුබිම ගොඩනැගී තිබීමත් නිසා ගැටුම දික්ගැස්සුණු සමාජ ගැටුමක් බවට විපරිවර්තනය වී ඇති බව නිගමනය කළ හැකිය. මේනිසා ගැටුම වැලැක්වීමට වඩා සමථන කාර්යක් තුළින් විසඳුම් ක්‍රියාවලියකට යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කළ යුතු වේ.

**මුඛ්‍ය පද**- අලි-මිනිස් ගැටුම, දේශපාලනික බල ව්‍යුහය, දික්ගැස්සුණු සමාජ ගැටුම, මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘතිකරණය, සහජාතීයකරණය

**හැඳින්වීම**

ශ්‍රී ලාංකේය ජන සමාජය විවෘත ආර්ථිකයට බද්ධ කිරීමත් සමඟ සමාජ, ආර්ථික හා සංස්කෘතික අංශයන්හි පරිවර්තනයක් සිදු විය. එනම් පුද්ගලයාගේ පරිභෝජනය, සහසම්බන්ධතා රටාව, ජනාවාසකරණය, සිතුම් පැතුම් ආදී සෑම අංශයකම පෙර පැවති සරල ආර්ථික ක්‍රමයකට වඩා වෙනසියාවකට ලක් විය. විශේෂයෙන්ම මානවයා මෙම ක්‍රියාකාරකම් රටාව කේන්ද්‍රය කර ගනිමින් නව ජීවන රටාවන් නිර්මාණය කර ගැනීමට වඩාත් උත්සුක විය. එහි ප්‍රතිඵලය වූයේ මානව ක්‍රියාකාරීත්වය ආත්මාර්ථය උදෙසා සංවිධානය වීමයි. අතීතයේ මානව සමාජය ස්වාභාවික පරිසරය සමඟ බද්ධ වී තිබුණි. සිය දෛනික අවශ්‍යතා තමා අවට පරිසරය තුළින් සොයාගත් අතර පරිසරය සමඟ සන්නිවේදනය ද සිදු විය. එනම් පුද්ගලයාගේ ජීවිතය පවත්වා ගෙන යාමට ඔහු විසින් ස්වාභාවික සම්පත් ඉවහල් කර ගත් අතර එම ස්වාභාවික සම්පත් අත් කර ගැනීමේ දී පරිසරයට හානිදායක නොවන ආකාරයෙන් එය සිදු කරන ලදී.

මානව ක්‍රියාකාරකම් හා ස්වභාව ධර්මය අතර මනා තුලනයක් හෙවත් සහයෝගීතාවයක් ඇතිවන ආකාරයෙන් පරිසර සම්පත උපයෝගී කර ගැණුනි. එසේම පරිසරයට දේවත්වයක් ආරෝපණය කරමින් මානවයා ස්වභාවික පරිසරයට හානිකිරීම අවම මට්ටමකින් පවත්වා ගෙන යන ලදී. ස්වාභාවික පරිසරයේ පවතින අලවර්ග, සතුන් දඩයම් කිරීම, ධාන්‍ය ආදිය මානවයාගේ ආහාරයේ මූලික කොටස් විය. මේ නිසා මානවයා පරිසරයේ  අනුයෝජනීය කොටසක් බවට පත් විය. ස්වාභාවික පරිසරයේ කොටසක් ම වූ සත්ව කොට්ඨාසය මානවයාගේ ආහාරයේ කොටසක් වුවත් ඔවුන් එදිනෙදා කාර්යයන් හා සම්බන්ධ කර ගැනීම ද සිදු විය. අනෙක් අතට මානව අවශ්‍යතා සරල මට්ටමක පැවති නිසා වනහානිය ද අවම විය. මේ නිසා සත්ව කොට්ඨාසයන්ට ඔවුන්ගේ නිජබිම් ආරක්ෂා කර ගැනීමටත් එම නිජබිම් තුළ සත්ව චර්යා පවත්වා ගෙන යාමටත් අවශ්‍ය මූලික ඉඩකඩ විවර විය (පෙරේරා, 2010).

මානවයා හා වනඅලින් අතර ගැටුමක් නොමැතිව සහජීවනයෙන් ජීවත්විය නොහැකි බව කෞටිල්‍ය විසින් ක්‍රි. පූ. 300 අතර කාලයේ දී  ඔහු විසින් රචිත අර්ථ ශාස්ත්‍රය නම් කෘතිය තුළින් අනාවරණය කරන ලදී ( Lahiri and Chaudhary, 1991) . ශ්‍රී ලාංකේය ජන සමාජය පිළිබඳව රොබට් නොක්ස් විසින්  ප්‍රකාශයට පත් කරන ලද An Historical Relation of the Island Ceylon in the East-Indies කෘතිය තුළින් වන අලින් හා මානව සමාජය අතර ගැටුම් නිර්මාණය වූ ආකාරය අනාවරණය කරයි. කෘෂි කාර්මික වගාවන් වර්ධනය වීමත් කෘෂි කාර්මික ප්‍රමිතයෙන් තොරව වගාවන්ගේ සිදු කිරීමත් නිසා සංකීර්ණ ගැටුමක් සමාජගත වී ඇති බව දක්වයි (සමරකෝන්, 2010). එමර්සන් ටෙනන්ට් 1867 දී ප්‍රකාශයට පත් කරන ලද The wild elephant and the Methods of Capturing and taming it in Ceylon කෘතිය මගින් වැවිලි ආර්ථිකය හා අලිමිනිස් ගැටුම අතර සෘජු සම්බන්ධතාවයක් පවතින බව අනාවරණය කරන අතර වන අලින් නිදසේ මරා දැමීම සඳහා රජය මගින් අවසර ලබා දුන් බවත් ඒ සඳහා රාජ්‍ය අංශය මගින් ප්‍රසාද දීමනාවන් ලබා දුන් බවත් අනාවරණය කරයි. එමරිසන් ප්‍රකාශ කරන පරිදි 1845-1848 දක්වා කාලය තුළ ලංකාවේ උතුරු පලාත තුළ වන අලින් 3500ක් මරා දැමූ බවත් ඒ සඳහා ප්‍රසාද දීමනා ලබා දී ඇති බවත් දක්වයි (Croze et. al, 1981, Wastson,1969, Chondhury,1991). දේශීය කෘෂි ආර්ථිකය නගා සිටුවීම සඳහා 1935 දී ක්‍රියාත්මක කරනු ලැබූ ඉඩම් සංවර්ධන පනත, කෘෂි ආර්ථිකය, ඉඩම් පරිහරණය හා ගොවිජනපද ව්‍යාපාරය සාම්ප්‍රදායික ලාංකේය සමාජ ව්‍යුහයේ සංකීර්ණතාවයන් නිර්මාණය කිරීමට පසුබිම් සපයා ඇත. ඉඩම් සංවර්ධන ආඥා පනත දේශීය කෘෂි ආර්ථිකය සංවර්ධනය කිරීම, විරැකියාව හා දරිද්‍රතාවය අවම කිරීම සඳහාත් ඉඩම් අහිමි ප්‍රජාවන් සඳහා රජය සතු ඉඩම් ලබාදීම නිසා ගොවි ජනපද ව්‍යාපාරය ඇති විය. ගල්ඔය, මිහින්තලය, ගිරිතලේ, රාජාංගනය, මහඉලුක්පල්ලම හා ජයන්තිපුර යනාදී ගොවිජනපද ව්‍යාපාරයන් කිහිපයක් විය (Gamage & Aheeyar, 1998). නව පදිංචිකරණයත් වනාන්තර මානව වාසභූමි බවට පත්වීමත් සත්ව ප්‍රජාවගේ කායික අවශ්‍යතා (ආහාර, වාසස්ථාන, ලිංගික ප්‍රජනනය) සංතෘප්ත කරගැනීමට සම්පත් සීමිත වීමත් සමග ගැටුම් ප්‍රක්ෂේපණය වීමක් සිදුවී ඇත. ප්‍රක්ෂේපිත ගැටුම සමස්ත පරිසර පද්ධතිය හායනයට පත් කිරීමට හේතු සාධක වූ අතර සමහර සත්ව ප්‍රජාව පරිසර පද්ධතියෙන් සමූල ඝාතනය වීමත් සිදුවිය. මෙනිසා පරිසර පද්ධතිය තුළ තුල්‍යතාවය බිඳවැටීමට පත්

වූ අතර ඇතැම් සත්ව ප්‍රජාවන් ගැටුම්කාරී පරිසර පද්ධතිය සමග අනුවර්තනය වීම සිදුවීම සුවිශේෂී කාරණයක් වේ. විශේෂයෙන්ම අලීන් ජීවවිද්‍යාත්මක ජවය හා බුද්ධිමය සාකල්‍යතාවය මානවයා හා සමාන ඉහළ අගයක් ගැනීම නිසා අසමතුලිත පරිසර පද්ධතිය සමග ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය කරගනිමින් අනුවර්තනය වීම සිදුවී ඇති බව පරිසර හා දේශපාලන විද්‍යාත්මක අධ්‍යයන මගින් අනාවරණය කරයි (Ishwaran, 1993, Jayawardane, 1993, Sukumar,1989, Wikramanayake et. al, 1998).

කෘෂි කාර්මික නිෂ්පාදනයන් ඉහළ යාමත් සාම්ප්‍රදායික අභිචාර ක්‍රමයන් සඳහා දක්වන අකැමැත්ත හා ශෂ්‍ය මාරු ක්‍රමයන් ක්‍රියාත්මක නොවීම ගැටුම සමාජගත වීමේ තීරණාත්මක සාධකයෝ වී ඇති බව අනාවරණය කළ හැකිවේ. කෘෂි කාර්මික ගොවිතැන් ව්‍යාප්තියත් සමග වනඅලීන්ගේ සාම්ප්‍රදායික ගමන් මාර්ගයන් අවහිර වීම හා සත්ව ප්‍රජාවගේ ජීවන පරිසරය කුඩාවීම අලි-මිනිස් ගැටුම වර්ධනය වීම සඳහා හේතු වී තිබේ. පාරිසරික ප්‍රතිලාභ අත්පත් කර ගැනීම සඳහා ගැටුම් පාර්ශව අතර තරගයක් නිර්මාණය වීමත් ජීවනෝපායන් අවහිරවීමත් නිසා ගැටුම දික්ගැස්සුණු සමාජ ගැටුමක් ලෙස සමාජගත වී තිබේ. කෘෂි කාර්මික අස්වැන්න පුද්ගලයාගේ පරිභෝජනය සඳහා භාවිත කළ අතර සත්ව ප්‍රජාවගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා භාවිත නොකිරීමත් ස්වභාවික පරිසරය තුළ වනසතුන්ගේ ආහාර පද්ධතිය කෘෂි කාර්මික කටයුතු සඳහා භාවිතයට ගැනීමත් නිසා ගැටුම සමාජය තුළ තෘවර වීමක් සිදුවී ඇත. කෘෂි කාර්මික අස්වැන්න විනාශ කිරීම, වන අලීන් මරණයට පත්වීම හා ආබාධයන්ට පත් වීම ගැටුම් පාර්ශවයන්හි ප්‍රකට කෘත්‍යයන් වේ. මේනිසා කුටුම්බය තුළ සුබසාධන කටයුතු බිදවැටීම, ආවස්ථයික පිරිවැය වර්ධනය වීම හා දරිද්‍රතාවය වර්ධනය වීම, නිජබිම් අහිමිවීම නිසා ආන්තීය හා දුෂ්සමාහිත කණ්ඩායමක් බවට ගැටුම් පාර්ශවය පත් වී ඇති බව අනාවරණය කළ හැකිය (Bandara, 2003, Nelson et al, 2003, Fernando et al, 2008). විශේෂයෙන්ම අලි-මිනිස් ගැටුම පිළිබඳව පර්යේෂණ සිදුකර ඇති බොහෝ පර්යේෂකයන්ගේ විශ්ලේෂණය අනුව යල කන්නය තුළ බෝග වගාවන් සඳහා වන අලීන්ගේ තර්ජනය වර්ධනය වී ඇති බව අනාවරණය කරයි. ආහාර හා ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වන අලීන් ගම්මානයන්ට ප්‍රවේශ වීම සිදුවන බව දක්වයි( Gunarathne & Premarathne, 2005). වියළි කලාපයේ සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයේ නිරත වූ පාරම්පරික ගොවියන් අලි-මිනිස් ගැටුම හේතුවෙන් කෘෂි කර්මාන්තයෙන් විතැන් වී වෙනත් විකල්ප රැකියාවන්හි සේවා නියුක්ත වීමක් හඳුනා ගත හැකි බව කරුණාරත්න (2011)ගේ අධ්‍යයනය මගින් අනාවරණය කරයි. පෞද්ගලික අංශයේ රැකියා, නිෂ්පාදන අංශයේ රැකියා(ගඩොල් කර්මාන්තය), දෛනික තුලී රැකියාවන්හි නියුක්ත වීම සිදුවී ඇත. මේනිසා සාම්ප්‍රදායික කෘෂි කාර්මික ගොවි පවුල කුළී ශ්‍රම පවුලක් දක්වා පරිවර්තනය වී ඇත.

ගුණරත්න (2009) ලංකාවේ අලි-මිනිස් ගැටුම පිළිබඳව අධ්‍යයනය කරමින් වියළි කලාපය තුළ දරිද්‍රතාවය වර්ධනය වීම සඳහා ගැටුම සෘජු සම්බන්ධතාවයක් දක්වා ඇති බව අනාවරණය කරයි. ගිරිබාව, ඇහැටුවැව, ලුණුගම්වෙහෙර සහ පොල්පිතිගම යන ක්ෂේත්‍රයන් කේන්ද්‍රකරගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇති අතර දරිද්‍රතා අනුපාතය 24.8% ක් වේ. එමෙන්ම ගැටුමේ විවිධත්වය හා දරිද්‍රතාවය අතර ඌනපූරක සම්බන්ධතාවයක් පවතින බව අනාවරණය කර ගත හැකි අතරම බහුවිධ සමාජ අන්තර් සම්බන්ධතාවයන් වියුක්ත වීමට ද ගැටුම ප්‍රධාන සාධකයක් වී ඇත.

ආර්ථික පිරිවැය, වර්තන වෙළඳපොළ ක්‍රියාකාරීත්වය හා ගැටුම අතර ත්‍රිකෝණාකාර සහසම්බන්ධිත ආකෘතිකමය සම්බන්ධතාවකින් යුක්ත ව මානව හා සත්ව ප්‍රජාව අතර ගැටුම විශ්ලේෂණය කළ හැකිවේ.  වගා හානිය, පුද්ගලයෙක් මරණයට පත්වීම හා කෘෂිකාර්මික ඉඩම් කැබලි වීම පවතින වෙළඳපොළ මිල හා වාර්ෂික ආදායම අතර තුලනාත්මක සබඳතාවක් සමග ගණනය කොට එහි වෙළඳපොළ වටිනාකම නිශ්චය කිරීම සිදු කර ඇත. මුල්‍යමය වෙළඳපොළ හා කුටුම්භයෙහි ආදායම් උත්පාදකයාගේ මුල්‍යමය වත්කම අහිමි වීම සමස්ත කුටුම්බයේ පිරිවැය විශ්ලේෂණය මගින් අනාවරණය කරයි. මේ හේතුවෙන් ව්‍යසන කළමනාකරණයත් මුල්‍යමය පිරිවැය සම්බන්ධතාවත් ගැටුමෙහි නිලීන සාධකයෝ වෙති (Santiapllai et al., 2010). ආර්ථික හා සමාජ අන්තර් සම්බන්ධතා විහීනතාවට පත්වීමත් කුටුම්බ ආදායමෙන් ගැටුම සමථනය සඳහා මූල්‍ය වත්කම් වෙන් කිරිමට සිදුවීමත් නිසා කුටුම්බය සුභසාධනය බිඳ වැටී තිබේ. දරුවන්ගේ පාසල් අධ්‍යාපනය අඛණ්ඩ ව

පවත්වා ගෙන යාම සඳහා කුටුම්බයෙහි මූල්‍ය වත්කම් හීන වීම අඩු වයසින් පාසල් හැර යාම සඳහා හේතු වී ඇත. පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීමත් අඩු වයසින් ප්‍රජනන පවුල බිහි කර ගැනීමත් හේතුවෙන් කුටුම්බයෙහි සමාජ, ආර්ථික ගැටලු මතු වී ඇති බව අනාවරණය වේ. මෙම කාරණා හේතුවෙන් මානව ජන සමාජය විහීනතා උගුලකට (Deprivation trap) හසු වී ඇත (Bandara, 2002) .

සාම්ප්‍රදායික දේශීය ඥානය හා නූතන තාක්‍ෂණික ක්‍රම ශිල්ප තුලනාත්මක ව යොදා ගැනීමත් ගැටුම් ආකෘතිමය වෙනසියාව තුළ දී එම ක්‍රමශිල්ප උපයෝගී කරගැනීම සමථකරණ ක්‍රියාවලිය සඳහා ශක්‍යතාපූර්වක ආකලිතයක් වන බව දක්වයි. නූතන තාක්ෂණික ක්‍රමෝපාය අනුගමනය කිරීම ගැටුම් පරිසරයේ සංස්කෘතිය සමග ආකලිත නොවීම හේතුවෙන් නව සංස්කෘතික පරිසරය සමග ආබද්ධ වීමට සත්ව ප්‍රජාවේ චර්යා රටාව වෙනස් නොවීම සෘජු වශයෙන් ගැටුම සමාජගත වීමට හේතු වී ඇති බව අනාවරණය කරයි. මේ හේතුවෙන් දේශීය වත්කම් සංචිත විදේශීය බහුජාතික සමාගම්වල ප්‍රාග්ධන සංචිත බවට පත්වී ඇත (Fernando et al., 2011).

තිරසාර පාරිසරික සංවර්ධනය හා මානව කේන්ද්‍රීයකරණය යන කාරණා අලි-මිනිස් ගැටුමෙහි තුලනාත්මක සාධක ලෙස හඳුනා ගත හැක. සංවර්ධන ප්‍රතිපත්තිවල තිරසාරත්වය පිළිබඳ සංකල්පයෙන් බැහැර ව සංකීර්ණ මානව අවශ්‍යතා පරිසර ප්‍රතිලාභ සමග තුලනය කිරීමත් සම්පත් අවභාවිතයත් හේතුවෙන් මෙය දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත් ව තිබේ. ස්වාභාවික සම්පත් අධි පරිභෝජනය, කෘෂිකාර්මික පරිසර පද්ධතියක් බිහි වීම, සත්ව ප්‍රජාව අතික්‍රමණය කරමින් මෙගා සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය තලයෙහි ක්‍රියාත්මක වීම හා නිජබිම් සංවර්ධන ව්‍යාපෘති සඳහා අවභාවිතය හේතුවෙන් සම්පත් අත්පත් කර ගැනීමට නොහැකි වීම ගැටුමේ ප්‍රකට හා නිලීන සාධක වේ. ජලාශ්‍රිත ශිෂ්ටාචාර බිඳ වැටීමත් සමග මිනිසුන් තෙත් කලාපයට සංක්‍රමණය වීමත් වියළි කලාපය ආශ්‍රිත ව ද්විතියික වනාන්තර වර්ධනය වීම අලීන්ගේ වාසභූමි අහිමි කිරීමට හේතු වී ඇත. මේ හේතුවෙන් තිරසර ක්‍රමෝපායන් සමථන ක්‍රියාවලියක් මගින් ඉටු කිරීමට වඩා තාවකාලික විසඳුම් ක්‍රියාවලින් කෙරෙහි අවධානය යොමු කිරීමට පුද්ගලයා පෙළඹී ඇති බව අනාවරණය කර යි (Gunawardane & Herath, 2018; ද සිල්වා, 2010; Santiapillai, 1996).

ගෝලීය ධනවාදී ආර්ථිකය තිරසාර සංවර්ධනය කාර්මීකරණය හා නාගරීකරණය මානවයා පරිසරය සමඟ පැවති අව්‍යයෝජනීය සබඳතාව බිඳදැමීමට හේතු විය. එනම් තරඟකාරී ආර්ථික රටාවන් පුද්ගලික්වය ඉස්මතු වීම, ලාභයට මුල් තැන දීම ආදී ප්‍රධාන ප්‍රස්තුතයන් මානවයා තුළ රෝපණය වීමත් සමඟ පැවති සහසම්බන්ධතා රටාව බිඳ වැටීමට පත් විය. විශේෂයෙන් ම මානව ක්‍රියාකාරීත්වයන් පරිසරය විෂයෙහි විෂමාකාරයෙන් දියත් කිරීමත් සමඟ ගැටලු රාශියක් උද්ගත විය. භූමි හායනය, ඕසෝන් වියන සිදුරු වීම, අම්ල වැසි, පාංශු ඛාදනය ඒ අතර ප්‍රබල ගැටලු බවට පත් විය. මෙහි ප්‍රතිඵලය වූයේ මානවයා තම තරඟකාරී අවශ්‍යතා ඉටු කර ගැනීමට මූලිකත්වය ලබා දීම විනා පරිසරය ආරක්‍ෂා කිරීමට කටයුතු කිරීමක් සිදු නොවීමත්ය. විශේෂයෙන්ම කාර්මීකරණයත් නව සංවර්ධන සංකල්ප ඉස්මතු වීමත් මත සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමට මානවයා පෙළඹීමක් වුවා මිස පරිසරය හා එහි සිටින සත්ව කොට්ඨාස ආරක්‍ෂාකිරීමට උනන්දුවක් නොදැක්වීම සිදු විය. අනෙක් අතින් නව සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය මට්ටමෙන් ස්ථාපිත වීමත් ජනගහනය වර්ධනය වීමත් මත වනාන්තර විශාල වශයෙන් එළිපෙහෙළි විය. මෙහි ප්‍රතිඵලය වූයේ වන සත්ව කොට්ඨාස ගම්මාන කරා ඇදී ඒමත් මානවයා හා සත්ව කොට්ඨාස අතර ගැටුම් නිර්මාණය වීමත්ය. නූතන සමාජ නවීකරණය හා නව සංවර්ධන ව්‍යාපෘති වල ක්‍රියාකාරීත්වය මත ඇති වූ මෙවැනි එක් ගැටුමක් වනුයේ අලිමිනිස් ගැටුමයි. විශේෂයෙන්ම වර්ධනය වන ජනගහනයට සාපේක්‍ෂව ඔවුන්ගේ නිවාස ඉදිකර ගැනීම සඳහා වනාන්තර කට්ටි වීම, සත්ව අභය භූමි ජනපදකරණයට ලක් වීම යන මූලික කාරණා නිසා විශාල වශයෙන් වනාන්තර එළිපෙහෙළි විය. එහි සෘජු ප්‍රතිඵලය වූයේ වනාන්තර තුළ අලීන් විසින් පරිභෝජනය කළ ආහාර පාන ආදිය නොමැති වීම නිසා ඔවුන් ගම්මානවලට සංක්‍රමණය වීමයි. මේනිසා වගාවන්වලට මෙන්ම ප්‍රජාවගේ නිවාස විනාශ කිරීම, මනුෂ්‍ය ඝාතනයන් සිදු කිරීම ඇතුලු නොයෙක් ක්‍රියාවලීන් සිදු විය. මේ තත්ත්වය ප්‍රධාන වශයෙන්ම මානවයාගේ ක්‍රියාවලිය හා බැදී තිබුණි. එනම් අලිමංකඩ හරස්කරමින් නොයෙක් ව්‍යාපෘති බිහිකිරීම,

නිවාස ඉදිකිරීම ඇතුලු මානව ක්‍රියාකාරීත්වයන් රාශියක් ඒ යටතේ  සිදු විය. මේ නිසා මානවයාගේ සෘජු මැදිහත් වීමේ ක්‍රියාවලිය මෙවැනි ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වීම විෂයෙහි  බලපා ඇත.

**අධ්‍යනයේ පරමාර්ථ හා අරමුණු**

**පරමාර්ථය**

දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය හා අලි- මිනිස් ගැටුම අතර පවතින ඌන පුරක සම්බන්ධතාවයේ ස්වභාවය හඳුනා ගැනීම

**අරමුණු**

1. ප්‍රජාවගේ දෛනික ජීවන රටාව සදහා ගැටුම බලපා ඇති ආකාරය හඳුනා ගැනීම

2. ගැටුම තුළ නිර්මාණය වී ඇති නව සංස්කෘතික අනුවර්තන රටාව ප්‍රජාවගේ සමුහ සංශක්තිය සදහා බලපා ඇති ආකාරය හඳුනා ගැනීම

3. ගැටුම් සමථනය සදහා මෑතකාලීනව ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි ප්‍රාමාණිකත්වය අනාවරණය කර ගැනීම

**සාහිත්‍ය විමර්ශනය**

අලි - මිනිස් ගැටුම පිළිබඳ නූතන ලෝකයේ අධ්‍යයන බහුල වශයෙන් සිදු කර ඇති බව සාහිත්‍ය විමර්ශන විශ්ලේෂණය කිරීමෙන් අනාවරණය කර ගත හැකි ය. එම අධ්‍යයන පාරිසරික විද්‍යාව, දේශපාලන දෘෂ්ටින්, අර්ථ ශාස්ත්‍රය හා ශුද්ධ විද්‍යාත්මක අධ්‍යයනවලින් විග්‍රහ කර තිබේ. ශාස්ත්‍රීය ලිපි ලේඛන, පූර්ව අධ්‍යයන, පර්යේෂණ ලිපි හා ප්‍රකාශන බහුවිධ සාකල්‍යතාවකින් මෙම අධ්‍යයන සිදු කර ඇතත් එම අධ්‍යයන්හි ශාස්ත්‍රීය පර්යාවන්ගේ දිශාගත වීමක් දැකිය හැකි ය (Fernando, 2011). එහෙයින් ශාස්ත්‍රීය සාර සංයුක්ත ගවේෂණයන්ට අවශ්‍ය පසුබිම් සාධක නිර්මාණය කිරීමට මේ මගින් හැකියාව ලැබේ. ඒ හේතුවෙන් පර්යේෂණ සාහිත්‍ය වඩාත් ප්‍රශස්ත මට්ටමට පත් කිරීමටත්, ගැටුම්වාදී ව්‍යුහීය ආකෘතිය අර්ථකථනීය විශ්ලේෂණයකින් අනාවරණය කර ගැනීමටත් ඒ හා සමගාමී පර්යේෂණ සාහිත්‍යයක් බිහි වීමට අවශ්‍ය පසුබිම් සාධක ගොඩනැගීම මෙමගින් සිදු වේ (Perera, 2009; Yeo & Neo, 2010; Ekanayaka et al., 2011).

කුටුම්බ දරිද්‍රතාව හා අලි - මිනිස් ගැටුම අතර සෘජු සම්බන්ධතාවක් පවතින බව පෙර අධ්‍යයන සමාලෝචන මගින් අනාවරණය කළ හැකි ය. ආර්ථික හා සමාජ අන්තර් සම්බන්ධතා විහීනතාවට පත්වීමත් කුටුම්බ ආදායමෙන් ගැටුම සමථනය සඳහා මූල්‍ය වත්කම් වෙන් කිරීමට සිදුවීමත් නිසා කුටුම්බය සුභසාධනය බිඳ වැටී තිබේ. දරුවන්ගේ පාසල් අධ්‍යාපනය අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා කුටුම්බයෙහි මූල්‍ය වත්කම් හීන වීම අඩු වයසින් පාසල් හැර යාම සඳහා හේතු වී ඇත. පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීමත් අඩු වයසින් ප්‍රජනන පවුල බිහි කර ගැනීමත් හේතුවෙන් කුටුම්බයෙහි සමාජ, ආර්ථික ගැටලු මතු වී ඇති බව අනාවරණය වේ. මෙම කාරණා හේතුවෙන් මානව ජන සමාජය විහීනතා උගුලකට (Deprivation trap) හසු වී ඇත (Bandara, 2002) .

දෛනික කාලය හා ආරක්ෂණ යාන්ත්‍රණය අලි - මිනිස් ගැටුමෙහි ප්‍රකට කෘත්‍ය ලෙස අනාවරණය කළ හැකි ය. කුටුම්බයෙහි මූලික අවශ්‍යතා ඉටු නොවීමත් බිඳුණු පවුල් පරිසරයක් බිහිවීමත් හේතුවෙන් දෛනික කාලය වක්‍ර ආර්ථික සංරචකයක් ලෙස ගැටුම තුළ ඉස්මතු වී ඇත. මේ හේතුවෙන් කුටුම්බයෙහි කායික හා චිත්තවේගීමය සහසම්බන්ධතා බිඳ වැටීමට ගැටුම හේතු වී ඇති බව අනාවරණය කරයි (Bandara, 2002; Santiapllai, 2010). ගැටුමේ පාදක කාරණා, ගැටුම් විසරණය පිළිබඳ පර්යේෂකයාගේ අවධානය යොමු නොකිරීම ඌනනයක් වේ. එහෙත් මෙම පර්යේෂණ පත්‍රිකාවේ කුටුම්බ සුභසාධනය වීම බිඳ වැටීම සඳහා ගැටුම පාදක වී ඇති ආකාරය අනාවරණය කිරීම පර්යේෂකයාගේ පර්යේෂණ සාහිත්‍ය සාරගර්භිතභාවය වර්ධනය කිරීමට හේතු වී ඇත.

ආර්ථික පිරිවැය, වර්තන වෙළඳපොළ ක්‍රියාකාරීත්වය හා ගැටුම අතර ත්‍රිකෝණාකාර සහසම්බන්ධිත ආකෘතිකමය සම්බන්ධතාවකින් යුක්ත ව ගැටුම විශ්ලේෂණය කර ඇත. වගා හානිය, පුද්ගලයෙක් මරණයට පත්වීම හා කෘෂිකාර්මික ඉඩම් කැබලි වීම පවතින වෙළඳපොළ මිල හා වාර්ෂික ආදායම අතර තුලනාත්මක සබඳතාවක් සමග ගණනය කොට එහි වෙළඳපොළ වටිනාකම නිශ්චය කිරීම සිදු කර ඇත. මුල්‍යමය වෙළඳපොළ හා කුටුම්භයෙහි ආදායම් උත්පාදකයාගේ මුල්‍යමය වත්කම අහිමි වීම සමස්ත කුටුම්බයේ පිරිවැය විශ්ලේෂණය මගින් අනාවරණය කරයි. මේ හේතුවෙන් ව්‍යසන කළමනාකරණයත් මුල්‍යමය පිරිවැය සම්බන්ධතාවත් ගැටුමෙහි නිලීන සාධකයෝ වෙති (Santiapllai et al., 2010). සන්තියාපිල්ලේ හා වෙනත් පර්යේෂකයන් විසින් (2010) ගැටුමෙහි මුල්‍යමය විශ්ලේෂණයක් සිදු කළත් එහි සමාජ පිරිවැය හා පාරිසරික පිරිවැය පිළිබඳ අවධානය යොමු නොකිරීම ඌනතාවක් වේ. එමෙන් ම ගැටුමෙහි මතුපිට සාධක පිළිබඳ සලකා බැලීමක් සිදු කළත් ගැටුමේ අභ්‍යන්තර සාධකවලට සම්පූර්ණයෙන් ම අවධානය යොමු නොකිරීම ගැටලු සහගත තත්ත්වයක් වේ. එහෙත් ගැටුම් පිළිබඳ විශ්ලේෂිත ආකෘතිකමය සංදර්භය න්‍යායික පර්යායක් මගින් විශ්ලේෂණය කිරීමේ දී පර්යේෂකයාට සාරගර්භිත ශාස්ත්‍රීය විශ්ලේෂණයකට අවශ්‍ය පසුබිම ගොඩනංවා ඇති බව අනාවරණය කළ හැකි ය.

සාම්ප්‍රදායික දේශීය ඥානය හා නූතන තාක්‍ෂණික ක්‍රම ශිල්ප තුලනාත්මක ව යොදා ගැනීමත් ගැටුම් ආකෘතිමය වෙනසියාව තුළ දී එම ක්‍රමශිල්ප උපයෝගී කරගැනීම සමථකරණ ක්‍රියාවලිය සඳහා ශක්‍යතාපූර්වක ආකලිතයක් වන බව දක්වයි. නූතන තාක්ෂණික ක්‍රමෝපාය අනුගමනය කිරීම ගැටුම් පරිසරයේ සංස්කෘතිය සමග ආකලිත නොවීම හේතුවෙන් නව සංස්කෘතික පරිසරය සමග ආබද්ධ වීමට සත්ව ප්‍රජාවේ චර්යා රටාව වෙනස් නොවීම සෘජු වශයෙන් ගැටුම සමාජගත වීමට හේතු වී ඇති බව අනාවරණය කරයි. මේ හේතුවෙන් දේශීය වත්කම් සංචිත විදේශීය බහුජාතික සමාගම්වල ප්‍රාග්ධන සංචිත බවට පත්වී ඇති බව අධ්‍යයන දත්ත සනාථ කරයි (Fernando et al., 2011). ෆොනැන්ඩු සහ සෙසු පර්යේෂකයන්ගේ (Fernando et al., 2011) පර්යේෂණ පත්‍රිකාව තුළ ගැටුම් සඳහා සාම්ප්‍රදායික හා නූතන ක්‍රම අනුගමනය කළ යුතු බව අනාවරණය කළත් එම ක්‍රම අනුගමනය කළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිතව හඳුනා ගැනීමක් සිදු කර නොමැත. එමෙන් ම මැදිහත්කරණ ක්‍රමය රාජ්‍ය අංශය මගින් ලබා දිය යුතු යැයි සඳහන් වුවත් එය ගැටුම් නිරාකරණය සඳහා යොදා ගත යුතු ආකරය පිළිබඳ අධ්‍යයනයෙහි අනාවරණය කර නොමැත. ගැටුමෙහි මතුපිට සාධක පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවේ දී සාකච්ඡා කිරීම ඌනතාවක් වේ.

''ලාභය'' නමැති සාධකය වැවිලි ආර්ථිකයේ, ප්‍රධාන ආර්ථික සාධකය වූ අතර එය නව කෘෂිකාර්මික ආර්ථිකයක් සඳහා විපරිවර්තනය කිරීමට පූර්වෝක්ත සාධක සපයා ඇති බව අනාවරණය කරයි. සාම්ප්‍රදායික කෘෂි ඉඩම් වැවිලි ආර්ථිකයකට විපරිවර්තනය කිරීම, පෞද්ගලිකත්වය ආත්මීයකරණයට ලක්කිරිම හා මුල්‍ය ආර්ථිකය සමස්ත ක්‍රියාවලිය මෙහෙයවන අදෘශ්‍යමාන හස්තය බවට පත්වීම හේතුවෙන් පරිසර ප්‍රතිලාභ මානව කේන්ද්‍රීයකරණයට ලක්වීම ගැටුමේ තත්ත්වාකාර සාධක ලෙස අනාවරණය කරයි (ගුණසේකර, 2011; බණ්ඩාර, 2002). ආර්ථික බෝග වගාව සමග පාරිසරික වශයෙන් සිදු වන බලපෑම මානව ක්‍රියාකාරකම් හා අන්තර් සම්බන්ධතා පැවැත්වීම ගැටුමේ පූර්වෝක්ත සාධක වශයෙන් හඳුනා ගැනීමට පර්යේෂකයා පෙලඹී ඇත. සංවර්ධන ක්‍රියාදාම හා නව ලිබරල්වාදී ආකෘතිකමය සාධක ගැටුම් සමථනය විෂයෙහි යොදා ගත හැකි ආකාරය පර්යේෂණයෙන් අනාවරණය කර නොමැති වීමත් ගැටුමේ පූර්වෝක්ත සාධක සමථනය සඳහා යොදා ගැනීමේ දී මානව හා සත්ව ප්‍රජාවගේ අවශ්‍යතා සමග තුලනය නොවීම ගැටුම නිර්මාණය වීමේ ප්‍රමුඛ සාධකයක් බව අධ්‍යයනය මගින් අනාවරණය කර නොමැති වීම ඌනනයක් වේ.

පාරිසරික සාධක හා සත්ව චර්යා සංස්කෘතිය පරිසර පද්ධතිය සමග තීරණාත්මක සාධකයන් වන අතර එම සාධක ඔවුන්ගේ මූලික අවශ්‍යතා සමග කේන්ද්‍රගත වන ආකාරය ධර්මරත්න සහ මාගෙදරගමගේ (2014) පර්යේෂණ ලිපිය මගින් අනාවරණය කරයි. අලි ඇතුන් විසින් සිදු කරනු ලබන වගා හානි රටා පැහැදිලි කිරීමේ පහසුව තකා අලින්ගේ වාසභූමි තෝරා ගැනීම, එම වාසභූමි අතර උන්ගේ බෙදීයාම, ආහාර රටා හා සමාජ ව්‍යූහය ආදිය මෙම ආකෘතිය මගින් ඔවුන් අනාවරණය කර ඇත. වගාවන් හානි කරනු ලබන අලින්ගේ චර්යා අවබෝධ කර ගැනීම, අලි - මිනිස් ගැටුම් පිළිබඳ විසඳුම් සොයා යාමේ දී ඉමහත් උපකාරයක් වන බවත් එය ගැටුම්

සමථකරණයට සෘජු ව අදාළ කර ගත හැකි බව මෙම පර්යේෂණ ලිපිය පරීක්ෂා කිරීමේ දී අනාවරණය වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක විශ්ලේෂණය කේන්ද්‍ර කර ගනිමින් මිශ්‍ර ක්‍රමවේදය (Mixed Method) උපයෝගී කර ගත් අතර එම ක්‍රමවේදය භාවිත කරමින් දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදි. ඒ අනුව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විග්‍රහයක් මගින් අධ්‍යයන ගැටලුව විශ්ලේෂණය කිරීමට වඩාත් යෝග්‍ය සමීක්ෂණ විධි ක්‍රමය (Babbie, 2004) වූ හෙයින් පර්යේෂකයාගේ අවධානය ඒ සඳහා යොමු විය. වයස් ව්‍යූහය, පුමතිරිභාවය, අධ්‍යාපන මට්ටම හා අලි - මිනිස් ගැටුම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා අලි - මිනිස් ගැටුමේ වින්දිතභාවය අධ්‍යයන ප්‍රදේශයෙහි විසරණය වී ඇති ආකාරය පිළිබඳ අනාවරණය කර ගැනීමට සමීක්ෂණ ක්‍රමවේදය වඩාත් යෝග්‍ය විය. මේ හේතුවෙන් විචල්‍යය අතර සංඛ්‍යාන දත්ත හා ගුණාත්මක දත්ත අන්තර් සම්බන්ධතා හා අන්තර් පරායත්තතාවන් දක්වන ආකාරය අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. විශේෂයෙන් ම ප්‍රමාණාත්මක දත්ත මගින් සාධනීය ලෙස විශ්ලේෂණය කිරීමට නොහැකි වූ දත්ත (Maxwell, 1996) වඩාත් ප්‍රායෝගික ව හා වින්දිතයන්ගේ ගැටලු, ආකල්ප වඩාත් යෝග්‍ය පරිදි ඉදිරිපත් කිරීමට ගුණාත්මක දත්ත පාදක විය. උදාහරණයක් ලෙස කුටුම්බයෙහි ආදායම අහිමි වීමේ ශීඝ්‍රතාව සංඛ්‍යාන දත්ත මගින් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබුණත් ආදායම් අහිමි වීම කුටුම්බයේ කවර අංශය සඳහා බලපා තිබේ ද යන්න අනාවරණය කර ගැනීමට ගුණාත්මක දත්ත යටතේ අධ්‍යයනය සඳහා තෝරාගත් ක්‍රම ඉවහල් විය. මේ හේතුවෙන් සංඛ්‍යානමය වශයෙන් ලැබුණ දත්ත පුරෝකථනමය විසරණයක සිට ගැඹුරු විශ්ලේෂණවලට අධ්‍යයනය විපරිවර්තනය කිරීමට හැකියාව ලැබුණි.

අලි - මිනිස් ගැටුම අධ්‍යයන ප්‍රදේශයෙහි පොදු ගැටලුවක් වුවත් එම ගැටලුව ප්‍රජාවේ පුද්ගලයන්ට විවිධතා ඇති කරන ලදි. මේ හේතුවෙන් ප්‍රජාවේ එක් එක් පුද්ගලයන්ට එහි බලපෑම වඩාත් නිශේධනීය ලෙස බලපා ඇති ආකාරය අනාවරණය කර ගැනීමට ප්‍රත්‍යෝක්ෂ අධ්‍යයන ක්‍රමය වඩාත් යෝග්‍ය විය. මේ අනුව අධ්‍යයන ප්‍රදේශ ද්විත්වය ම කේන්ද්‍ර කර ගනිමින් ප්‍රත්‍යෝක්ෂ අධ්‍යයන 02ක් උපයෝගී කර ගැනුණි. අධ්‍යයනය සඳහා කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා 03ක් උපයෝගී කරගත් අතර එහි දී වයස් ව්‍යූහයන්, රැකියාවන්ගේ ස්වභාවය, අලි - මිනිස් ගැටුම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවා අසාර්ථක වීමට හේතු වූ කාරණා පිළිබඳ අවධානය යොමු කිරීම නිසා සමස්ත ප්‍රජාවට එහි ඇති බලපෑම ගැඹුරින් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. විශේෂයෙන් ම කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා හා ප්‍රත්‍යෝක්ෂ අධ්‍යයන කෙරෙහි පර්යේෂකයාගේ අවධානය යොමු වූයේ සංඛ්‍යාන දත්ත මගින් අනාවරණය කරගත් තොරතුරු තවදුරටත් ගුණාත්මක දත්ත මගින් තහවුරු කිරීමටත් සංඛ්‍යානමය දත්ත මගින් අනාවරණය නො වූ තොරතුරු අධ්‍යයන ගැටලුව සාධනය කිරීමට දක්වන විභවතාව විශ්ලේෂණය කිරීම සඳහා ය. මේ හේතුවෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත බහුවිධ ව ගැටලුව ගොඩනැංවීමට සිදු කරන කාර්යයන් අනාවරණය කර ගත හැකි විය. අධ්‍යයනයේ දේපොළ හා ජීවිත හානි, පුමතිරිභාවය, ආදායම් මට්ටම හා ණය ලබා ගැනීම සඳහා හේතු වූ කාරණා ආදි මූලික තොරතුරු තනි විචල්‍යයන් ලෙස විසරණය වී ඇති ආකාරය අනාවරණය කර ගත හැකි විය. ප්‍රශ්න මාලාව මගින් ලබාගත් දත්ත මත පදනම් ව මෙම විසරණය සනාථ විය. කුටුම්බයේ ආදායම් මට්ටම ස්වායත්ත විචල්‍ය ලෙස භාවිත කරමින් කුටුම්බ සාමාජිකයන් සංඛ්‍යාව, රැකියාවේ ස්වභාවය සමස්ත ගැටුම තුළ අනාවරණ දත්ත මගින් හෙළි කර ගත හැකි විය. මේ හේතුවෙන් ස්වායත්ත විචල්‍යයේ බලපෑම පරායත්ත විචල්‍යය විසරණය වීම සඳහා කවර හේතු සාධක බලපෑමක් සිදු කරන්නේ ද යන්න අනාවරණය කර ගැනීමට අවකාශ ලැබුණි. සමස්ත ස්තර අතර ගැටුමේ සමාජ, ආර්ථික හා සංස්කෘතික බලපෑම විසරණය වී ඇති ආකාරය අනාවරණය විය.

ප්‍රාථමික දත්තවලට අමතර ව ද්විතීයික දත්ත මෙම පර්යේෂණ ගැටලුව විශ්ලේෂණය කිරීමේ දී අත්‍යවශ්‍ය වේ. ඒ අනුව උක්ත පර්යේෂණයට අදාළ ව ලිය වී ඇති පර්යේෂණ වාර්තා, පොත්පත්, පුවත්පත්, වාර සඟරා, අන්තර්ජාලය, ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වීය පාරිසරික ගිවිසුම් පිළිබඳ අත්පොත හා වනජීවී දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධ ව ලියවී ඇති ශාස්ත්‍රීය මූලාශ්‍රය පරිශීලනය කරන ලදි.

**අධ්‍යයන නියැදිය**

අධ්‍යයන නියැදිය ලෙස සසම්භාවී නියැදිය යටතේ ස්තෘත (Stratified Sampaling) නියැදිය තෝරා ගන්නා ලදි. එමෙන් ම අධ්‍යයන නියැදියේ දී සහජාතීයත්වය ආරක්ෂා කර ගැනීම හා විචල්‍යයන්ගේ හැසිරීමේ ස්වභාවයේ පවතින ගතික බව සඳහා වයස් ව්‍යුහය, අධ්‍යාපන මට්ටම, සේවා නියුක්තියේ ස්වභාවය හා පුමතිරිභාවය කෙරෙහි අවධානය යොමු කිරීම සිදු විය. අධ්‍යයන ප්‍රදේශය ග්‍රාමීය අංශය නියෝජනය කිරීම හේතුවෙන් එම ප්‍රජා කණ්ඩායම් භූගෝලීය වශයෙන් පදිංචි වී ඇති ආකාරය, නිවාස රටාවේ හා රැකියාවේ ස්වභාවය යන ස්ථරීකරණ සාධකය සැලකිල්ලට ගත් අතර එම සංකේන්ද්‍රණය වීම මගින් ග්‍රාමීය ඒකකයේ පන්ති පදනම් ව්‍යාප්තික රටාව පිළිබඳ ව ද නියැදියෙහි අන්තර්ගත කරන ලදි. මෙහි දී ස්තර ජනගහන නියැදියට අදාළ ව ග්‍රාම නිලධාරී කොට්ඨාස ද්විත්වය තුළින් ම සමානුපාතික ස්තර නියැදියට යටත් ව නියැදිය තෝරා ගැනීම සිදු විය. තණමල්විල ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රකාශයට පත් කරන ලද තෝරා ගත් අධ්‍යයන ක්ෂේත්‍රයන්හි ග්‍රාම නිලධාරී වාර්තා පරිශීලනය කරමින් ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙක සඳහා 5%ක නියැදියක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. එය පහත පරිදි වගු සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කළ හැකි ය.

**වගු අංක 01-නියැදි ජනගහනය**

| ග්‍රාමනිලධාරී කොට්ඨාසය | මුළු පවුල් සංඛ්‍යාව | නියැදිය |
|---|---|---|
| **හම්බෙගමුව** | 560 | 28 |
| **හම්බෙගමුව ජනපද** | 440 | 22 |
| **මුළු එකතුව** | **1000** | **50** |

**මූලාශ්‍රයඃ-ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023**

**දත්ත විශ්ලේෂණය**

ප්‍රශ්න මාලාවෙන් ලැබුණු දත්ත සංඛ්‍යාන විද්‍යාව උපයෝගී කරගනිමින් වගු හා ප්‍රස්තාර සටහන් මගින් ඉදිරිපත් කරන ලදි. සංඛ්‍යාන දත්ත මගින් සනාථ කරගත් තොරතුරු ගුණාත්මක දත්ත මගින් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය වීම හේතුවෙන් දත්තවල විචලනය වීම හා තොරතුරුවල වලංගුභාවය තහවුරු කිරීමට දත්ත අතර සැසඳීමක් සිදු කරන ලදි. එමගින් අධ්‍යයනයේ අනාවරිත දත්තවලට වාස්තවික පදනමක් ලබා දෙන ලදි. ඒ අනුව ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය මගින් බහුවිධ ප්‍රශ්න අතර අන්‍යෝන්‍ය සහසම්බන්ධතාව අනාවරණය කරන ලදි. එමෙන් ම සංසිද්ධීන් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර දැඩි සහසම්බන්ධතාවක් පවතින්නේ නම් ඒ අතුරින් එක් සංසිද්ධියක් අනෙකුත් ඒවා ඇති කරලීමට හේතුකාරක වන බව පිළිගනු ලැබිණි. තවද සංසිද්ධීන් ගණනාවක් එකට පවත්නා සේ පෙනී ගිය ද එකිනෙක අතර සම්බන්ධතාවක් නැති බව ද පෙනී ගිය අවස්ථා පවතී. එක් සංසිද්ධියක් අනෙක් සංසිද්ධිය නිර්මාණය කිරීමේ හේතුව නොවන බව ඇතැම් අවස්ථාවන්හි දී ප්‍රත්‍යක්ෂ විය. එවැනි අවස්ථාවන්හි දී තුන්වන සාධකයක් අදාළ සංසිද්ධීන් දෙක ම බිහි කරලීමේ හේතුකාරකය වී ඇති බව පෙනී ගිය අවස්ථා ද පවතී.

**අධ්‍යයන ප්‍රදේශය - මොනරාගල දිස්ත්‍රික්කයේ හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය**

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත රැස්කිරීමට යොදා ගනු ලැබූ අධ්‍යයන ප්‍රදේශය මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් දෙකකි. එනම් 149 හම්බෙගමුව හා 149 - 1 හම්බෙගමුව ජනපදය යි. තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය වර්ග කිලෝමීටර් 666.5 පමණ විශාල වූ තැනිතලා භූමියකින් යුක්ත ප්‍රදේශයක් වේ. මෙම ප්‍රදේශය අතීතයේ දී කොරන්ගල බිම්තැන්න, කෝරලය හා සින්තරම් පළාත් කෝරලය නමින් බල ප්‍රදේශ දෙකකට වෙන් ව තිබූ බව සඳහන් වේ. ප්‍රදේශයේ තැනිතලා ස්වභාවය හේතුවෙන් ''බිම්තැන්න'' යන නාමය ලැබී ඇති බව ජනශ්‍රැති මගින් අනාවරණය වේ. තණමල්විල ප්‍රදේශීය ලේකම්

කොට්ඨාසයේ නැගෙනහිරින් හම්බන්තොට දිස්ත්‍රික්කයට මායිම් වන අතර දකුණින් සෙවනගල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට මායිම් ව ඇත. එමෙන් ම උතුරින් වැල්ලවාය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට ද බටහිරින් රත්නපුර දිස්ත්‍රික්කයට ද ඊසාන දිගින් බදුල්ල දිස්ත්‍රික්කයට ද මායිම් ව පිහිටා තිබේ (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019). තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 14ක් වන අතර භූගෝලීය, සමාජීය හා ආර්ථික වශයෙන් ගතිකත්වයන් නිර්මාණය වී ඇති බව අනාවරණය කළ හැකි ය. එහෙයින් එම සාධක අධ්‍යයන ප්‍රදේශයේ සුවිශේෂීත්වයට මෙන් ම අදාළ පර්යේෂණ ගැටලුව වඩාත් සාධාරණීකරණයට ලක් කිරීමට හේතු විය.

**හම්බෙගමුව**

තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසම අනෙකුත් ග්‍රාම නිලධාරී වසම් සමග සන්සන්දනය කිරීමේ දී විශාලත්වයෙන් ඉහළ ම ග්‍රාම නිලධාරී වසම වේ. වර්ග කිලෝමීටර් 107.52 වන අතර මුළු ජනගහනය 3162ක් වේ (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019). ආගම් විවිධත්වය අනුව බහුවිධ ස්වරූපයක් හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසමෙහි හඳුනාගත හැකි වන අතර ජාතීන් අනුව සමස්ත ජනගහනය සිංහල ජනවර්ගය වේ. පර්යේෂකයා විසින් මෙම සමාජ ගතිකත්වය පිළිබඳ මූලික අවධානය යොමු කරනු ලැබුවත් ප්‍රතිචාරකයන් ගම සම්බන්ධයෙන් අනාවරණය කරන ලද ජනශ්‍රැති කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. එහෙයින් අධ්‍යයනය සඳහා සහවේදන ක්‍රමය උපයෝගී කර ගැනීමට පර්යේෂකයා සෑම විටම උත්සාහ කළේ ය. ඒ අනුව ප්‍රජාවන් පාරම්පරික කෘෂිකර්මාන්තය මත ජීවනෝපාය සකස් කර ගැනීමත් හේන් ගොවිතැන මූලික ජීවනෝපාය බවට පත් වීමත් අභිචාර විධි ගම්මානයේ වගාවන් සඳහා වර්තමානයේ භාවිත වීමත් අධ්‍යයන ප්‍රදේශයේ ජනශ්‍රැතියෙහි පවතින සුවිශේෂීතාව වේ. එහෙයින් වන සතුන් වඩාත් ආකර්ෂණයක් පවතින හේන් වගාවන් හේතුවෙන් ගැටුම් වඩාත් සුලභ වී ඇති බව අනාවරණය විය. පර්යේෂකයා හම්බෙගමුව ගම්මානයෙහි අධ්‍යයන කටයුතු සඳහා මෙම සුවිශේෂී ක්‍රම ද්විත්වය සම්මිශ්‍ර ව සහජාතික සම්බන්ධතාවක් මත අධ්‍යයනය සිදු කිරීම ද සුවිශේෂී කරුණක් වේ.

**හම්බෙගමුව ජනපදය**

වර්ග කිලෝමීටර් 37ක් පමණ වන හම්බෙගමුව ජනපදය 2562 ජනගහනයකින් සමන්විත වේ (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019). මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රජාවගේ ප්‍රධාන ජීවනෝපාය වන අතර හම්බෙගමුව වැව, දෙමෝදර වැව, මහකරමැටිය වැව ආශ්‍රිත ව ධීවර කර්මාන්තය කේන්ද්‍රගත ව පවතී. ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා ධීවර සමුපකාර සමිති ක්‍රියාත්මක වුවත් ඒවායේ පවතින අකාර්යක්ෂමතාව මත ධීවර ප්‍රජාවගේ අවශ්‍යතා හා ගැටලු සඳහා සෘජු සම්බන්ධීකරණයක් නොවන බව ප්‍රතිචාරක මතය විය. දේශපාලනීකරණය හා ධීවර පන්ති ක්‍රමයක් ගම්මානයෙහි ස්තරායනගත වීමත් ප්‍රතිලාභ එම පන්ති අතර දෝලනය වීමත් හේතුවෙන් ධීවර ගැටලු විසඳීම ද පන්ති සාධකය මත පදනම් විය. ප්‍රධාන වැව කේන්ද්‍ර කර ගනිමින් නිවාස රටාව බිහි වීමත් එම නිවාස රටාව ඉදිවීමේ පවතින අවිධිමත්භාවය අලි - මිනිස් ගැටුම තුළ පාදක කාරණා වී ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් සහවේදන ක්‍රමය සෑම විට ම පර්යේෂකයා අනුගමනය කිරීමට පෙලඹීමත් හම්බෙගමුව ජනපදය හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසමෙහි උප ග්‍රාම නිලධාරී වසමක් බවට පත්වීමත් මත අධ්‍යයනය සඳහා පූර්ව පසුබිම නිර්මාණය කරන ලදි. ඒ අනුව හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසම කේන්ද්‍රීය ගම ලෙසත් හම්බෙගමුව ජනපදය පෝෂක පරිධිය ග්‍රාමය ලෙසත් පර්යේෂකයාගේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට හේතු සාධක විය.

**අධ්‍යයනය සඳහා හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය තෝරා ගැනීමට හේතුව**

අධ්‍යයනය සඳහා අදාළ ග්‍රාම නිලධාරී වසම් දෙක තෝරා ගැනීමට බලපාන ලද හේතු සාධක කිහිපයකි.

01. තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් අතුරින් අලි - මිනිස් ගැටුමේ තීව්‍රතාව බහුල ව හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදයෙන් අනාවරණය විය (ද්විතීයික දත්ත පරිශීලනයෙන්). මෙම තීව්‍රතාව ජීවිත, දේපොළ හා වගා හානි දක්වා පරාසයක පැතිරුණි. මේ

හේතුවෙන් අනෙකුත් ග්‍රාම නිලධාරී වසම් හා සංසන්දනාත්මක කරුණු පිළිබඳ විග්‍රහ කිරීමේ දී ගැටුම් වඩාත් පරාසගත ව මෙම ග්‍රාම නිලධාරී වසම් දෙක තුළින් හඳුනා ගත හැකිවි ය.

02. ජීවනෝපායන්ගේ පැවති සුවිශේෂීතාව, දරිද්‍රතාවෙන් අධික ප්‍රජාවක් අධ්‍යයන ප්‍රදේශ ද්විත්වයෙහි වාසය කිරීම ඉඩම් භුක්ති රටාවේ අවිධිමත්භාවයට ප්‍රධාන සාධකයක් විය. මේ හේතුවෙන් ගැටුමේ න්‍යෂ්ටික පදනම හා උපපරිධිය පද්ධති අතර චල්‍යතාව අනෙකුත් ගම්මාන හා සාපේක්ෂ ව අධ්‍යයනය කිරීමේ දී සුවිශේෂී සාධක විය. මේ තත්ත්වය සමස්ත අධ්‍යයන ප්‍රදේශයේ අඩු වැඩි වශයෙන් අනාවරණය කර ගත හැකි වීම සුවිශේෂී කරුණක් විය.

03. හම්බෙගමුව ජනපදය හම්බෙගමුව ග්‍රාමයෙන් නිෂ්පන්න ග්‍රාමයක් වීම, එම නිෂ්පන්න සාධක හේතුවෙන් සංක්‍රමණික ග්‍රාමයක් වීම අධ්‍යයන ප්‍රදේශයේ සුවිශේෂීත්වයක් වේ.

ඉහත දැක්වූ පරිදි ශ්‍රී ලංකාවේ ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය යන ගම් දෙක මෙම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනු ලැබුණි.

**විශ්ලේෂණය හා අනාවරණයන්**

අධ්‍යයනයට අදාළව දත්ත විශ්ලේෂණ කිරීම සඳහා තේමා 4ක් උපයෝගී කර ගැනීම සිදුවන අතර තෝරා ගත් ගම්මාන දෙකෙහි සන්සන්දනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීම සිදුකරන ලදී.

1. ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු, සමාජ කණ්ඩායම් හා ගැටුමේ තත්ව සාධක ග්‍රාමීය බල ව්‍යුහය තුළ ස්ථාපිත වීම

2. සාම්ප්‍රදායික දේශීය ඥානය, පාරිසරික සම්පත් පරිභෝජනය හා ගැටුම් කළමණාකරණය

3. සාර්ව හා සූක්ෂම බල ව්‍යුහීය ආකෘතිය ග්‍රාමීය සමාජය තුළ ධූරාවලීගත වී ඇති ආකාරය

4. සංවර්ධන ව්‍යාපෘතිකරණය, ග්‍රාමීය පරිසරය හා ප්‍රජාව බාහිර සමාජයට විවෘත වීම

1. **ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු, සමාජ කණ්ඩායම් හා ගැටුමේ තත්ව සාධක ග්‍රාමීය බල ව්‍යුහය තුළ ස්ථාපිත වීම**

**ප්‍රතිචාරකයන්ගේ වයස් ව්‍යුහය, ප්‍රමතිරිභාවය හා ගැටුමේ සමාජ කෘත්‍ය**

බල ව්‍යුහීය ආකෘතිය අධ්‍යයන ප්‍රදේශය තුළ ප්‍රජාවගේ වයස් ව්‍යුහය හා ප්‍රමතිරිභාවය යන සාධක මත විචලනය වී ඇති බව අනාවරණය කළ හැකිය. කුටුම්බය තුළ තත්ව සාධකය හා තත්ව භූමිකාව අතර ගැටුමේ අනුයාත සම්බන්ධතාවයත් එම අනුයාත සම්බන්ධතාවය තත්ව කාර්යභාරය ප්‍රතිනිෂ්පාදනය කිරීමටත් හේතු සාධක වී ඇත.

**වගු සටහන් අංක 02- පුමතිරිභාවය හා වයස් කාණ්ඩය අලිමිනිස් ගැටුමේ ප්‍රකට කෘත්‍ය**

| | මරණයට පත්වූ ප්‍රජාව | | පූර්ණ ආබාධිත | | අර්ධාබාධිත | |
|---|---|---|---|---|---|---|
| **වයස් ව්‍යුහය** | **ස්ත්‍රී** | **පුරුෂ** | **ස්ත්‍රී** | **පුරුෂ** | **ස්ත්‍රී** | **පුරුෂ** |
| **18-35** | 03 | 12 | 12 | 18 | 01 | 17 |
| **36-45** | 06 | 14 | 08 | 15 | 05 | 14 |
| **46-55** | 04 | 17 | 06 | 19 | 12 | 11 |
| **55>** | 03 | 16 | 07 | 06 | 03 | 14 |

**මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය**, 2023

අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි පුමතිරිභාවය, වයස් ව්‍යුහය හා ගැටුමේ කෘත්‍යාත්මක ව්‍යුහීය සම්බන්ධතාවය ප්‍රකට කෘත්‍යමය සාධකයක් ලෙෂ දැක්විය හැකිය. මෙම සම්බන්ධතාවය ගැටුමත් සමග ජීවිත හානි අධ්‍යයන ප්‍රදේශය තුළ සිදුවී ඇති ආකාරය තුළින් අනාවරණය කරගත හැකිය. ජීවිත හානි පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පුරුෂයන් ගැටුම තුළින් බහුලව වින්දිතභාවයට පත්වී

ඇත. කෘෂිකාර්මික, ධීවර හා ඉදිකිරීම් කර්මාන්තයන්හි සේවාමුරය වඩාත් දීර්ඝවීමත් ආදායම් උත්පාදක කාර්යේදී පුරුෂයා කේන්ද්‍රකරගත් රැකියා අවස්ථා බිහිවී තිබීමත් නිසා වින්දිත පුරුෂයන්ගේ ජීවිත අවධානම වර්ධනය වී ඇති බව අනාවරණය විය. අධ්‍යයන ප්‍රදේශය තුළ උපප්‍රවර්ග කේතනයන් මගින් සනාථවන කාරණය නම් වයස අවුරුදු 46 -55 ත් පුරුෂ වයස් කාණ්ඩය ගැටුමේ කේන්ද්‍රීය වින්දිතයන් වී ඇති බවයි. මෙම කාණ්ඩය තරුණ වැඩිහිටි කාණ්ඩය නියෝජනය කරන ප්‍රජා කණ්ඩායම වේ. විශේෂයෙන්ම පුරුෂ වයස් ව්‍යුහය තුළ ද මරණයට පත්වූ පුරුෂ කාණ්ඩය මෙම වියැති රේඛාවේ නියෝජනය වීමත් අනෙකුත් වයස් කාණ්ඩ හා සැසඳීමේ දී ගෘහ කුටුම්භයේ කාන්තා මූලික පවුල් බිහිවීම සාපේක්ෂව ඉහළ අගයක් ගෙන ඇත.

පූර්ණ ආබාධිතභාවයට පත් වූ වින්දිත පුරුෂ ප්‍රජාවද ස්ත්‍රී ප්‍රජාව හා සැසඳීමේ දී ඉහළ අගයක් වී ඇතිබව අනාවරණය කළ හැකිය. මේ නිසා ගෘහ කුටුම්භය තුළ **''ආදායම් උත්පාදකයා''** ආබාධිතභාවයට පත්වීම කුටුම්භ සුබසාධනය තුළින් අවධානම් සහගත කණ්ඩායමක් බවට පත්වීමට හේතු වී තිබේ. මේනිසා ගෘහ කුටුම්භය තුළ කාන්තාවගේ භූමිකාව වඩාත් සංකීර්ණ වීමේ ස්වභාවයක් හදුනා ගත හැකිවිය. ආදායම් උත්පාදන කාර්ය, ගෘහීය කටයුතු හා සාත්තු සේවිකාවක් ලෙස කාර්යභාරය සංකීර්ණ වීම ගැටුම කාන්තාව වින්දිතභාවයට පත් කිරීමට හේතු වී ඇති බව සනාථ කළ හැකිය. මේනිසා පුරුෂයාගේ කාර්යභාරයෙන් කොටස් කුටුම්භයේ පිරිමි දරුවන් සඳහා ලබාදීම **''ඡායා පුරුෂ කාර්යභාරය''** සඳහා අනුගත කිරීමක් ලෙස හඳුනාගත හැකිය. මේනිසා අනාගත භූමිකාව සඳහා පෙරහුරුවක් ගෘහ කුටුම්භයේ පිරිමි දරුවන් සඳහා ලබාදීම ගැටුමේ නිලීන සාධකයක් වී ඇති බව අනාවරණය කළ හැකිය. මේනිසා පීතෘ කාර්යභාරය පිරිමි දරුවන් සඳහා අනුගත කිරීමත් එම අනුගත කිරීමේ කාල රේඛා දීර්ඝ වීමත් නිසා ළමුන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීමට ද හේතු වී ඇති බව අනාවරණය විය. මේනිසා ගැටුම තුළ පුමතිරිභාවය නැමති සාධකය හා අලි මිනිස් ගැටුම අතර අවිච්ජින්න සම්බන්ධතාවයක් පවතින බවබ සනාථ කළ හැකිය. එය පහත ප්‍රත්‍යයයික අධ්‍යයනය තුළින් අනාවරණය කළ හැකි වේ.

| රාමු අංක 01<br><br>**ප්‍රත්‍යයික අධ්‍යයන අංක 01-කෘෂිකර්මාන්තයේ නිරත කාන්තාවක් ,අවුරුදු 36, හම්බෙගමුව** |
|---|
| *'' මහත්තයා පැල් රකින්න ගිහිල්ලා තමයි අලියා ගහලා ඔත්පල වුණේ. දැන් මාස 06ක් විතර වෙනවා. මට දැන් ළමයිගේ වැඩයි, හේනේ වැඩයි, මෙයැයිට සාත්තු කරන්නයි ගියාම පැය 24ම ඉවරයි. මොකද මෙයැයි එක තැන් වුණාට පස්සේ ඇදේම තමයි ඔක්කොම කාර්යයන් කරන්නේ. ඒවා අස්කරලා උදේට කෑම උයලා ළමයි ඉස්කෝලේ ඇරලා ආයිත් හේනට ගිහිල්ලා ඒකෙත් වැඩ කරලා දවල් 12.00 එන්න ඕන. කට්ටියට කන්න උයන්න. තේ දෙන්න. ඊට පස්සේ ළමයි ආවට පස්සේ ආපහු හේනේ වැඩට යන්න ඕන. ගිහිල්ලා එද්දී හැන්දෑවේ 6.00-7.00 වෙනවා. සමහර දවසට රෑ වෙලා එන්න බයයි අලියා එන පාරේ රැකගෙන ඉන්නවා. මට ඔක්කොම වැඩ කරන්න බැරිනිසා මගේ ලොකු පුතා ඉස්කෝලෙ ගමන නතර කරා ගිය අවුරුද්දේ. එයා 10 පන්තියට විතරයි ගියේ. තාත්තගේ වැඩයි හේනේ වැඩයි ගෙදර අනෙක් වැඩයි කරන්න බැරි නිසා එයා ඉස්කෝලේ ගමන නතර කරලා. මාත් එක්ක හේනට යනවා. සමහරදාට මට හේනට යන්නේ නැති වුණාම පුතා තමයි හේනේ වැඩ කරන්නේ.* |

අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි ගෘහ කුටුම්භය තුළ කාන්තාව අලි මිනිස් ගැටුම නිසා මරණයට පත්වීම පුරුෂයන් සමග සන්සන්දනය කිරීමේ දී පහළ අගයක් ගෙන ඇත. කාන්තාවන්ගේ මියයාම ගෘහ කුටුම්භයේ පුරුෂයාගේ භූමිකාව සංකීර්ණ වීමට හේතුවී ඇති අතර **''ඡායා කාන්තා භූමිකාව''** සඳහා අනුගත වීමට හේතු වී ඇත. ගෘහීය කටයුතු සඳහා පුරුෂයාගේ භූමිකාව වෙනසියාවකට ලක්වීම කාන්තා කාර්යභාරය සඳහා පෙරහුරුවක් ලබාදීම වේ. මේනිසා ගෘහ කුටුම්භය තුළ ගැහැනු දරුවන් තීරණාත්මක සාධකයක් වී ඇති බව අනාවරණය විය. එනම් පියාගේ ගෘහීය කටයුතු සඳහා සහයෝගී කණ්ඩායමක් ලෙස ගෘහය තුළ කටයුතු කරනු ලැබේ. මේනිසා පියාගේ බහුවිධ කාර්යභාරයේ දී ගෘහීය කටයුතු සඳහා **''අත්උදව්කරුවන්''** ලෙස ගැහැණු දරුවන් කටයුතු කර ඇති බව අනාවරණය විය. පුරුෂ මූලික ගෘහ කුටුම්භයේ කාන්තාවගේ වියෝවීම ගෘහමූලිකයාගේ භූමිකාව කාන්තා මූලික ගෘහ කුටුම්භයේ කාන්තාවගේ කාර්යභාරය මෙන් වඩාත්

සංකීර්ණ වී නොමැත. නමුත් ගැටුමේ තීවර සාධක කුටුම්භය තුළ දාරක කාර්යභාරය වියුක්ත වීමටත් ඔවුන්ගේ ස්වයං සාධන අවශ්‍යතා බිඳවැටීමටත් හේතුවී ඇති බව අනාවරණය කළ හැකිය.

**2. සාම්ප්‍රදායික දේශීය ඥානය, පාරිසරික සම්පත් පරිභෝජනය හා ගැටුම් කළමණාකරණය**

**සාම්ප්‍රදායික සමාජයේ ගම හා වනය අතර පැවති සම්බන්ධතාවයේ ස්වභාවය**

අධ්‍යයන ප්‍රදේශය තුළ පරිසරය හා මානව ප්‍රජාව අතර අනුකලනමය සහසම්බන්ධතාවයක් හඳුනා ගත හැකිවිය. කෘෂි ආර්ථිකය සමග තෝරා ගත් ගම්මාන දෙක තුළ දෛනික පාරිභෝජන අවශ්‍යතා ස්වභාවික පරිසරය සමග බද්ධ කර ගැනීමත් ආර්ථික ක්‍රියාවලිය එයට අනුයාතව සකස් කර ගැනීමත් සිදුවිය. සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තය පරිසර සාධකයන් සමග අනුයාතව සකස් කර ගැනීමත් පාරිසරික ප්‍රතිලාභ තුලනාත්මකව බෙදා ගැනීමත් මත පරිසර තුල්‍යතාවය සාම්ප්‍රදායික සමාජයේ හඳුනා ගත හැකිවිය. කෘෂි කාර්මික කාර්යභාරයන් ආරම්භ කිරීමට පෙර පරිසරයට දේවත්වයක් ආරෝපණය කරමින් වන්දනා මාන කිරීම, මුල්ම අස්වැන්න දෙවියන් උදෙසා පුජා කිරීම යන කාර්යභාරයන් ගම හා වනය අතර පැවති සම්බන්ධතාවය තහවුරු කරන සාධකයන් වේ. එමෙන්ම අස්වැන්න ආරක්ෂා කර ගැනීම සඳහා සතුන්ගේ රූප සහිත (අලීන්ගේ රූප) සහිත පුවරු ප්‍රදර්ශනය කිරීම මගින් ගැටුම් සමථනයටඅවශ්‍ය කාර්යභාරය සකස් කර ඇති බව අනාවරණය විය. අධ්‍යයන ප්‍රදේශය තුළ සාම්ප්‍රදායික සමාජයේ ගම හා වනය අතර පැවති සම්බන්ධතාවයේ ස්වභාවය ප්‍රධාන අදියර 3කින් හඳුනා ගත හැක.

1. රක්ෂිතයට  නැඹුරු වු ග්‍රාමීය ප්‍රජාව

2. රක්ෂිතයට ආකර්ශනය වු ප්‍රජාව

3. රක්ෂිතයට බාහිරස්ථ ප්‍රජාව

රක්ෂිතයට නැඹුරු වු සහ රක්ෂිතයට ආකර්ශනය වු ප්‍රජාව  දෛනික චර්යාව මුළුමනින්ම වනය සමග කටයුතු කිරීමක් දැකිය හැකිය. හේන් ගොවිතැන, වී ගොවිතැන ජීවනෝපායන්හි ප්‍රධාන සාධකයන් බවට පත්වීමත් ආර්ථිකය මුළුමනින්ම රක්ෂිතය සමග බද්ධ වීමත් තුළ පාරිසරය හා ජනජීවිතය වනය සමග බද්ධ වීමමක් සිදුවී ඇත. එය පුද්ගලයාගේ ආර්ථික සාදකය මත තීරණය වී ඇති කාරණයක් වේ.

**සාම්ප්‍රදායික දේශීය ඥානය, අධි ස්වභාවික ධූරාවලිය හා නවලිබරල් ධනවාදය**

කෘෂි කර්මාන්තය හා ධිවර කර්මාන්තය ප්‍රධාන ජීවනෝපායන් බවට පත් වු මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙකෙහි සාම්ප්‍රදායික අභිචාර විධි අනුගමනය කිරීම අතීතයේ දී බහුලව හඳුනා ගත හැකිවිය. විශේෂයෙන්ම හම්බෙගමුව සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය බවට පත් වු ග්‍රාමීය ප්‍රජාවක් වාසය කරන නිසා ඔවුන් කෘෂි අස්වැන්න නෙලා ගැනීමත් සමග කුරුළු පාළුව, සතුන් සඳහා කෘෂි ඉඩමෙන් කොටසක් වෙන් කිරීම හා මී මැසි පාලනය ආදී කාර්යයන්හි නිරත විය. මෙම කෘෂි ඉඩමෙහි සතුන් සඳහා කොටසක් වෙන් කිරීම නිසා කෘෂි අස්වැන්න ආරක්ෂා කර ගැනීමට හැකිවිය. මෙනිසා සතුන් ගම්වැදීම හෝ කෘෂි අස්වැන්න විනාශ කිරීම වැනි කාර්යයන් සිදු නොවු බව අනාවරණය විය. එමෙන්ම සතුන්ගෙන් වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ආනතික හැඩයට කාණු කැපීම, දිය පොකුණු ඉදිකිරීම නිසා සත්ව හානිය අවම විය. කෘෂි අස්වැන්න වැපිරීමට පෙර පුල්ලෙයාර්, කඩවර හා අයියනායක දෙවියන්ට පුජා පැවැත්වීම මගින් අස්වැන්න වනසතුන්ගෙන් ආරක්ෂා කිරීම මෙන්ම අස්වැන්න සඳහා කෘමින්ගෙන් හානි සිදුනොවීම සඳහාත් කන්නලව් කිරීම සිදුවේ.

| |
|---|
| **රාමු අංක 06**<br><br>**ප්‍රත්‍යෙයික අධ්‍යයන අංක 04-, සෝමවතී, අවුරුදු 68, ගෘහණියකි** |
| *'' ඉස්සර අපේ තාත්තලා ගොවිතැන් කරන්න ගන්නකොටම දෙවියන්ට යාග කරලා සතුන්ගේ කොටහ* |

*අයින් කරලා තමයි අස්වැන්න වැපුරුවෙත් නෙලා ගත්තෙත් ඒ උදවිය තමයි අපිට අපේ වගාව ආරක්ෂා කරලා* දෙන්නේ. අපි පරිසරයේ ඉන්න සතුන්ටත් හැම අස්වැන්නෙන්ම කොටසක් ඉතිරි කරනවා මොකද උන්ට වවාගෙන කන්න බැහැනේ. උන්ට කුරුළු පාළුව වගේ දේවල් ඉතිරි කරාම අපේ අසුවැන්ට හානියක් කරන්නෙත් නැහැ. අනෙත් එක අපි මුතුන්මිත්තෝ හැමදාම මීා සිවුපාවත් එක්ක හිටිය වගේම හොඳ සම්බන්ධතාවයකුත් තිබුණා. ඒ අද වෙද්දී මේ වගේ සාම්ප්‍රදායික දේවල් දැන් ඉන්න උදවිය අනුගමනය කරන්නේ නැහැ. ඒ අය තාක්ෂණෙත් එක්ක තමයි හැම වැඩේම කරන්නේ ඒ වගේම හැම තිස්සේම පරිසරය ගැන හිතනවාට වඩා තමන්ගේ ගොඩ වැඩිකර ගන්න බලනවා. ඒක නිසා මුතුන්මිත්තන් අනුගමනය කළ දේවල් අද පරම්පරාව අනුගමනය කරන්නේ නැහැ.

කෘෂි ගොවි කම්ටු මගින් මෙම අභිචාර උත්සවයන් පැවැත්වීම සිදුවන අතර ගමෙහි සියලුම ප්‍රජාව මේ සඳහා සහභාගීවීම සිදුවේ. ග්‍රාමීය සමාජය තුළ අභිචාර විධි ක්‍රියාත්මක වීමේ ස්වභාවය තුළ ප්‍රජාව සමාජ ඒකාබද්ධතාවය සමග අනුකලනය කිරීමක් මෙමගින් හඳුනා ගත හැකිවේ. ගම තුළ පවතින ඒකාබද්ධතාවය ප්‍රජාව තුළ සමූපකාරී බව, සමූහ සංශක්තිය හා අන්තර් යැපීම හා අන්තර් පරායත්තතාවය නිර්මාණය වී ඇති බව අනාවරණය කළ හැකිය. සාම්ප්‍රදායික සමාජය තුළ අනුවර්තනීය වෙනසියාවක් ඇති කිරීම සඳහා අභිචාර විධි ධනාත්මක පසුබිමක් නිර්මාණය කර ඇත. මෙම ධනාත්මක වෙනසියාව ග්‍රාමීය කෘෂි ආර්ථිකය සමග බද්ධ කිරීම මගින් ප්‍රජාව තුළ සමාජ අන්තර් සම්බන්ධතා වර්ධනය වී ඇති බව අනාවරණය විය. කෘෂි වගාවන් සමූහයක් සමග සිදු කිරීම, අස්වැන්න ආරක්ෂා කිරීමේ සමූපකාරී බව හා අස්වැන්න නෙලා ගැනීමේ දී සාම්ප්‍රදායික ක්‍රමවේදයන් අනුගමනය කිරීම මගින් සාම්ප්‍රදායික සමාජය තුළ සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කර ඇත. විශේෂයෙන්ම අත්තම් හා කයියි වැනි සාම්ප්‍රදායික ක්‍රමයන් සාම්ප්‍රදායික ගම තුළ කෘෂි කර්මාන්තයේ දී භාවිත කර ඇති අතර සාමූහික විඥානය, සමූහ ගතිකත්වය යන සංරචක ශක්තිමත් කිරීමක් සිදුව ඇති බව අනාවරණය කළ හැකිය. වී ගොවිතැන සඳහා භාවිත කරන ගොපලු දෙවියන් වන්දනය ආදී අභිචාර විධි අනුගමනය කර ඇති අතර සමූහික විඥානය හා සමූහ සංශක්තිය වර්ධනය කිරීමේ සාධකයෝ වී ඇති බව සනාථ කළ හැකිය.

හම්බෙගමුව ජනපදය තුළ මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය බවට පත් වූ අතර පැහැදිලි අභිචාර විධික්‍රමයක් භාවිත කළ බවට සාධක නොමැත. කෘෂි කර්මාන්තයේ දී මෙන්ම පුල්ලෙයාර් දෙවියන් සඳහා අභිචාර ක්‍රමයන් අනුගමනය කර ඇති අතර වැවෙහි මත්ස්‍ය සම්පත අනිසි ලෙස ප්‍රයෝජනයට ගනු ලබන ප්‍රජාවන් සඳහා අනබෝල් තැබීම වැනි ක්‍රමයන් අනුගමනය කර ඇති බව අනාවරණය විය. හම්බෙගමුව ජනපදය තුළ ද කෘෂි කාර්මික නිෂ්පාදනයන් කිරීම සිදු වූ අතර ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ගයන් හම්බෙගමුව ගම්මානයට සමාන විය.

අධ්‍යයන ප්‍රදේශය තුළ සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තය වානිජකරණයට ලක්වීමත් සාම්ප්‍රදායික අභිචාර ක්‍රමෝපායන් අනුගමනය කිරීමට අකැමැත්ත හා උනන්දුවක් නොමැතිවීම නිසා රක්ෂිතය හා මානව සමාජය අතර පැවති සම්බන්ධතාවය බිඳ වැටීමට පත් වී ඇත. *'' අපිට ඉස්සර මිනිස්සු වගේ පූද පූජා කරන්න දැන් වෙලාවක් නැහැ. කාර්යබහුලතාවය වැඩි වෙලා තියෙන්නේ. අපිට ලොකු කොම්පැණිකාරයෝගේ නිෂ්පාදනයන් සමග තරග කරන්න සිද්ධ වෙලා තියෙන්නේ. ඒක නිසා කොම්පැණිකාරකයන් එක්ක තරග කරන්න අවශ්‍ය අඩු කාලයකින් අස්වැන්න ගන්න පුළුවන් බෝග තමයි වගා කරන්නේ. ඒක නිසා අපි දැන් කරන්නේ පුල්ලෙයාර් දෙවියන්ට කන්නලව් කරලා වගාවන් ආරම්භ කරනවා.''*

ධනවාදී ආර්ථික ක්‍රමය ග්‍රාමීය සමාජය තුළ සමාජගත වීමත් ජීවනෝපායන් ධනවාදී ආර්ථිකයේ පරිධිය ශක්තිමත් කිරීම නිසා එයට අනුගත නව ප්‍රජාවක් ග්‍රාමීය සමාජය තුළින් බිහිවිය. ලාභය, ප්‍රාග්ධන හා තරගකාරීත්වය යන සාධකයන් ධනවාදී ආර්ථික ක්‍රමයේ තීරකයන් වී ඇති අතර අධ්‍යයනික ගම්මානය තුළ ද එම ලක්ෂණ සාධනය වීම ධනවාදී කෘෂි ආර්ථිකයකට ප්‍රජාව අනුවර්තනය කිරීමක් බව අනාවරණය කළ හැකිවේ. මෙනිසා සමූහ සංශක්තිය, සාමූහික විඥානය, අනුකලනය හා ඒකාබද්ධතාවය වානිජ කෘෂි ආර්ථිකය සමග විපරිවර්තනයකට ලක්වී ඇත.


**3. සාර්ව හා සූක්ෂම බල ව්‍යුහීය ආකෘතිය ග්‍රාමීය සමාජය තුළ ධුරාවලීගත වී ඇති ආකාරය**

**බල ව්‍යුහීය ආකෘතිය, නිලබලකරණය හා ග්‍රාමීය සම්පත් සුරාකෑමේ අදියරයන්**

හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය තුළ බල ව්‍යුහීය සාධකය පාරිසරික සම්පත් හා පාරිසරික සම්පත් විසරණය මත පදනම් වී ඇති බව අනාවරණය කළ හැකිය. සංචාරක ආකර්ශනය, භූ ගෝලීය පිහිටීම යන කාරණයන් ග්‍රාමීය සමාජය මහා සමාජය සඳහා විවෘත වීමේ සාධකයෝ වෙති. අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි බල ව්‍යුහීය ආකෘතිය ග්‍රාමීය අංශය තුළ ක්‍රියාත්මක වීමේ දී ප්‍රධාන ස්ථර 4ක් හඳුනා ගත හැකි අතර එක් ස්ථරයක් අනෙක් ස්ථරය ශක්තිමත් කිරීම සිදුවේ.

1. ග්‍රාමීය  දේශපාලන බල ව්‍යුහය
2. නිලබල ධුරාවලී බල ව්‍යුහය
3. ජාතික දේශපාල බල ව්‍යුහය
4. බාහිර නිලබලකරණයේ ප්‍රතිපත්ති ව්‍යුහය

**රූප සටහන් අංක 01-අධ්‍යයන ප්‍රදේශය තුළ බල ව්‍යුහීය ආකෘතියේ ස්වභාවය**




**මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය**, 2023

''සංවර්ධන ව්‍යාපෘති හා ග්‍රාමීය ආර්ථිකය සංවර්ධන කිරීම'' ප්‍රකට කෘත්‍ය ලෙස සමාජගත කිරීම මගින් බල ව්‍යුහීය ආකෘතිය ගම තුළ ක්‍රියාත්මක වී ඇති බව අනාවරණය විය. බල ව්‍යුහීය ආකෘතියේ නිලධාරීතන්ත්‍රය අන්තර් සම්බන්ධීකරණය තුළින් මුඩු ඉඩම් හා රක්ෂිතයේ ඉඩම් දේශපාලන හිතෛෂීභාවයත්වය මත විකිණීම හා බදු දීම සිදුවී ඇත. විශේෂයෙන්ම **''ලාභය''** නැමති සාධකය ප්‍රමුඛ කාරණයක් වී ඇති අතර බල ව්‍යුහයේ ඉහල සිට පහල ස්ථර සඳහා ප්‍රතිලාභ බෙදී යාම මත එක් බල ස්ථරයක් විසින් අනෙක් බල ස්ථරය ශක්තිමත් කිරීම සිදුවේ.


**රාමු අංක 02**

**කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා 01-කෘෂිකර්මාන්තයේ ප්‍රජාව, හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය**

*'' මේ ගම්මාන දෙකේම ඉඩම් අද මංකොල්ල කාලා තියෙන්නේ මේ රටේ දේශපාකලයන්. 99 බද්දට කියලා කොලඹ පැත්තේ ඉන්න මහත්තරුන්ට ලොකු ගණන් වලට මේ ගමේ ඉඩම් විකුණලා තියෙනවා. මොකද මේ ගමේ පස හොද සරුවට තියෙනවා. වගාවට හොදයි. මිරිදිය ධීවර කර්මාන්තයටත් හොද ආදායමක් තියෙනවා. මේ අය ඉඩම ගත්ත ගමන් කරන්නේ ඉඩම වට කරලා තමන්ගේ මුදලින් අලි වැට දාගෙන කර්මාන්ත ගොවිතැන් පටන් ගන්නවා. ඒක නිසා ගොඩක් අලි ගම්වැදලා තියෙන්නේ. ඉඩම් ලබා දෙන කොට දිස්ත්‍රික්ක ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ඉඩම් කොමසාරිස්, ගමේ ප්‍රදේශීය සභාවේ ඉන්න දේශපාලකයන් විතරක් නොවෙයි පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරුත් සම්බන්ධ වෙනවා. ඒක නිසා ගමෙන් කොච්චර විරෝධතා මතු වුණත් දේශපාලන හයිය උඩ ගමේ ඉඩම් කුණු කොල්ලයට විකුණනවා වගේම තෑගි ලෙසත් දෙනවා.*

**ගම තුළ ක්‍රියාත්මක අවිධිමත් බල ව්‍යුහීය ආකෘතිය හා අලි-මිනිස් ගැටුමේ උභතෝකෝටිකය**

ගම තුළ ක්‍රියාත්මක බාහිරස්ථ සාධක ලෙස විවිධ පනත් සංශෝධනය කිරීම නෛතික ආධිපත්‍ය නිලබල ආකෘතිය වටා සංකේන්ද්‍රණය කිරීම මගින් හෙජමොනික් බල අධිපතිත්වය ග්‍රාමීය සමාජය තුළ ක්‍රියාත්මක වී ඇත. මෙම බල ව්‍යුහීය ආකෘතිය ගම තුළ ක්‍රියාත්මක වීමේ ස්වභාවය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී විධිමත් ධුරාවලියක් හා අවිධිමත් ධුරාවලියක් ගම තුළ නිර්මාණය වී තිබීම විශේෂිත කාරණයක් වේ. අවිධිමත් ධුරාවලිය ග්‍රාමීය ප්‍රජා කණ්ඩායම් තුළින් නිර්මාණය වී ඇති අතර ඔවුන් ඡායා බල අධිකාරී ව්‍යුහයක් ලෙස ක්‍රියාත්මක වේ. එම බල ව්‍යුහයේ ධුරාවලිය පහත පරිදි වේ.





මෙම ඡායා ධුරාවලිය විධිමත් ධුරාවලිය සඳහා අවශ්‍ය පාරිසරික පහසුකම් ලබාදීම සඳහා කටයුතු කරන අතර ගම තුළ භෞතික සම්පත් අත්පත් කර ගැනීමේ දී හා සම්පත් සංවිධානය කිරීමේ දී විධිමත් කාර්යභාරයක් මෙම ස්ථරය විසින් සිදුකරයි. එමනිසා විධිමත් ධුරාවලිය සඳහා බලපෑම්

කිරීමත් විධිමත් ධුරාවලියේ සම්පත් මහා පරිමාන ව්‍යාපෘති හා ව්‍යාපාරයන් සඳහා සංවිධානගත කිරීමේ අදෘෂ්මාන බලවේගයක් ලෙස මොවුන්ගේ ක්‍රියාකාරීත්වය ගම තුළ ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම මෙගා සංවර්ධන ව්‍යාපෘති මගින් සම්පත් මංකොල්ලකරණයක් සිදුවී ඇති අතර එම සම්පත් මංකොල්ලකරණයේ සංරචක ශක්තිමත් කිරීමට බල ධුරාවලිය ක්‍රියාත්මක වී ඇති බව අනාවරණය විය.

**කුටුම්බය තුළ දෛනික කාර්යභාරය හා අලි-මිනිස් ගැටුමේ උභතෝකෝටිකයේ ස්වභාවය**

අලි - මිනිස් ගැටුම කුටුම්බයෙහි දුෂ්කෘත්‍යමය කාර්යාවලියක් බිහි කිරීමට අවශ්‍ය හේතු සාධක සපයා ඇති බව අධ්‍යයන දත්තවලින් අනාවරණය වෙයි. ප්‍රාථමික හා ද්විතීයික අවශ්‍යතා බිඳ වැටීම, බිඳුණු පවුල් පරිසරයක් නිර්මාණය වීම හා කුටුම්බ සංශක්තිය වියුක්ත වීම ගැටුමේ ප්‍රකට හා නිලීන කෘත්‍යයන් ලෙස අනාවරණය කළ හැකි ය. එය පහත ප්‍රස්තාර සටහන මගින් විග්‍රහ කළ හැකි ය.

**ප්‍රස්ථාර අංක 01-අලි -මිනිස් ගැටුම කුටුම්බ ක්‍රියාකාරීත්වය සඳහා සිදුකර ඇති බලපෑම**




**මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023**

කුටුම්බයෙහි ගෘහ මූලිකයා වගා ආරක්ෂා කර ගැනීම සඳහා රාත්‍රී මුර සේවයේ යෙදීම නිසා ගෘහ කුටුම්බය සාමාජිකයන්ගේ ආරක්ෂණ යාන්ත්‍රණය ව්‍යුත්පන්න වී ඇති බව අධ්‍යයන දත්ත මගින් සනාථ කළ හැකි ය. මේ හේතුවෙන් මූලික ගෘහ කුටුම්බයේ බිරිඳ හා දරුවන් හුදකලා වන අතර එය ලිංගික අභිප්‍රේරණය සඳහා සෘජු බලපෑමක් සිදු කර ඇති බව අනාවරණය කළ හැකි ය. අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි එය 24% ක් වේ. මේනිසා කුටුම්බ කාර්යය ව්‍යුත්පන්න වීමත් දරුවන් බිහි කිරීමට අවශ්‍ය කාල වකවානු දීර්ඝ වීම දුෂ්කෘත්‍යමය සාධකයක් වී ඇති බව අනාවරණය කළ හැකි ය. එමෙන් ම රාත්‍රී මුර සංචාරක සේවය හේතුවෙන් අඹුසැමි සම්බන්ධතා දුරස්ථ වීම අනියම් සම්බන්ධතා වර්ධනය වීම සඳහා හේතු සාධක වී ඇති බව අධ්‍යයනය මගින් සනාථ විය. හම්බෙගමුව ජනපදයේ පහත සඳහන් කාන්තාවගේ ප්‍රත්‍යෝක්ෂ අධ්‍යයන මගින් මෙම කාරණය ස්ථුප කළ හැකිවේ.

| |
|---|
| **රාමු අංක 03**<br><br>**ප්‍රත්‍යෝක්ෂ අධ්‍යයනය අංක 02** |
| *" නයනා අවුරුදු 40ක් වයසැති හම්බෙගමුව ජනපදයේ ගෘහනියක් වේ. කුටුම්බය තුළ ගෘහ මූලිකයා රාත්‍රී කාලය තුළ කෘෂි වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගෘහයෙන් බැහැර වීමත් ගෘහය තුළ බිරිඳ හා දරුවන් හුදකලාවීමත් ලිංගික ප්‍රේරණයන් ඉටු නොවීමත් නිසා ගැටුම් නිර්මාණය වන බව දක්වයි. ප්‍රාථමික ප්‍රේරණ අවශ්‍යතා කුටුම්බය තුළ* |

*සාමාජිකයාගෙන් ඉටු නොවීම අනියම් සම්බන්ධතා වර්ධනය වීම සඳහා පූර්ව සාධක සපයා ඇති බවත් එම නිසා ගෘහස්ත හිංසනයන් අධ්‍යයන ප්‍රදේශය තුළ බහුලව සිදුවන බවත් අනාවරණය විය. කුටුම්බය තුළ අන්තර් සම්බන්ධතා බිඳවැටීම හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වර්ධනය සඳහා සෘජු දායකත්වයක් අලි - මිනිස් ගැටුම සිදුකර ඇති බව මැයගේ අදහස තුළින් ගම්‍ය වේ''*

අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි මාසික ව මෙවැනි ගැටලු විසඳා ගැනීම සඳහා ග්‍රාම නිලධාරීවරයා වෙත පැමිණිලි 10 - 12ක් වාර්තා වන බව සනාථ කර ගත හැකි විය. මේ හේතුවෙන් ගෘහස්ථ හිංසනය, දික්කසාද වීම හා සියදිවි නසා ගැනීම වැනි බහුවිධ සමාජ ප්‍රශ්න අධ්‍යයන ක්ෂේත්‍රයෙන් අනාවරණය විය. අනාවරිත දත්ත විශ්ලේෂණය කිරීමේ දී මෙවැනි සමාජ ගැටලු නිර්මාණය වීම සඳහා කුටුම්බයේ අන්තර් සම්බන්ධතා බිඳ වැටීම සමුච්චිත කාරණයක් ලෙස දැක්විය හැකි ය. එමනිසා සමාජානුයෝජන කාර්යය නිසි පරිදි සිදු නොවීම හා දරුවන්ගේ පෝෂණය සම්බන්ධ ගැටලු නිර්මාණය වීම දුෂ්කෘත්‍යමය සාධක ලෙස හඳුනා ගත හැකි විය.

අලි - මිනිස් ගැටුම හා ප්‍රජාවන්ගේ මනෝසමාජීය සෞඛ්‍ය බිඳවැටීම අතර සෘජු සම්බන්ධතාවක් පවතින බව අනාවරණය කළ හැකි ය. එය අධ්‍යයන නියැදියට අනුව 22%ක් වේ. මානසික සෞඛ්‍ය බිඳ වැටීම දෛනික ක්‍රියාකාරකම් නිසි පරිදි ඉටු කර ගැනීමේ ගැටලුව හේතුවෙන් කුටුම්බයෙහි කෘත්‍යාත්මක ක්‍රියාවලිය සාධනය කර ගැනීමට නොහැකි වේ. එමෙන් ම සමාජ සම්බන්ධතා ජාලය විධිමත් ව පවත්වා ගෙන යාම සඳහාත් ස්වයංසාධන අවශ්‍යතා ඉටු කර ගැනීමේ දීත් මෙම ප්‍රතිජානාත්මක සම්බන්ධතා බහුසාක්‍යකව නිර්මාණය වීම විශේෂ ලක්ෂණයක් වේ. ආරක්ෂණ යාන්ත්‍රණය බිඳ වැටීම, කුටුම්බ සහයෝගීතාව බිඳ වැටීම, සියදිවි නසා ගැනීම, අපේක්ෂාභංගත්වය හා චිත්තවේගීමය ගැටලු  අධ්‍යයන ප්‍රදේශයෙහි මනෝසමාජීය ජනජීවිතය බිඳ වැටීමට හේතු වී ඇති කාරණයන් වේ. මේ හේතුවෙන් ක්ලමථය, විශාදය, වැනි බහුවිධ මානසික රෝග ප්‍රජාවේ වර්ධනය වී ඇති බව අනාවරණය විය.

කුටුම්බයෙහි ආරක්ෂණ යාන්ත්‍රණය ගෘහ මූලිකයා කේන්ද්‍ර කර ගනිමින් සිදු වන  අතර අලි - මිනිස් ගැටුම හේතුවෙන් එම ක්‍රියාවලිය ද ව්‍යුත්පන්න වී ඇත. දෛනික කාලයෙන් පැය 10 - 12ක් කෘෂිකාර්මික කාර්යය හා මුර සේවයේ නියුක්ත වීම හේතුවෙන් කුටුම්බයෙහි ස්නේහක හා රැකවරණය කෘත්‍ය බිඳ වැටීමට හේතු වී ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් පොදු වාසස්ථානය නමැති පවුලේ කාර්යයභාරය වියුක්ත වී ඇති බව දැක්විය හැකි ය. ආරක්ෂණ යාන්ත්‍රණය බිඳ වැටීම හා අලි - මිනිස් ගැටුම අතර සෘජු සම්බන්ධතාවක් පවතින බවත් එම විචල්‍යයවල හැසිරීම හා සහසම්බන්ධතා කුටුම්බ දෛනික ක්‍රියාකාරකම් වියුක්ත කිරීමට නිශේධනීය පසුබිමක් ගොඩනැගී ඇත. ආරක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ දී ආර්ථික ක්‍රියාකාරකම් හා කුටුම්බයේ කාර්යභාරය අතර සමුච්චිත සම්බන්ධතාවක් පවතින බවත් එම සමුච්චිත සම්බන්ධතාව අලි - මිනිස් ගැටුමේ කේන්ද්‍රීය සාධකයක් බවට පත් වීමත් එම කේන්ද්‍රීය සාධක කුටුම්බයේ පරිධිය සාධක වියුක්ත කිරීමට හේතු වී ඇති බවත් අනාවරණය කළ හැකි ය.

විවාහ සම්බන්ධතා තීරණය කිරීමේ දී විවාහයේ ස්වරූපය කේන්ද්‍රීය සාධකයක් වේ. විශේෂයෙන් ම අන්තර්ජණ්‍ය විවාහ සම්බන්ධතා ලාංකේය සමාජයේ සාධිත සංස්කෘතික ලක්ෂණයක් වේ. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ අලි - මිනිස් ගැටුම පාදක සාධකය වීමත් එහෙයින් විවාහයේ පර්යාය සාධක වියුක්ත වීමත් හේතුවෙන් බහිර්ජණ්‍ය විවාහයන් සඳහා නැඹුරුතාව වර්ධනය වී ඇති අතර එය අධ්‍යයන නියැදියට අනුව 19% ක් වේ. කෘෂිකර්මාන්තයත් සමග කෘෂිකර්මාන්තය හා බැඳී පවතින වැඩ කටයුතු සංකීර්ණ වීමත් හේතුවෙන් අඩු වයසින් ප්‍රජනන පවුල ගොඩනගා ගන්නා බව අවිධිමත් සාකච්ඡාවලින් ද සනාථ විය. එහෙයින් කෘෂිකාර්මික කාර්යයන් සඳහා පලපුරුදු හා ඒ සඳහා කාලය කැප කළ හැකි කාන්තාවන් කෙරෙහි විවාහයේ දී අවධානය යොමු කරන බව ප්‍රතිචාරකයන්ගේ අදහස වේ. එහෙයින් විවාහයේ මූලික ප්‍රතිමානික සාධක අවම වීමත් ආර්ථික සාධකය විවාහයේ කේන්ද්‍රීය සාධක බවට පත් වී ඇති බව සනාථ කළ හැකි ය. මේ හේතුවෙන් සමාජ පර්යාය ප්‍රතිසංවිධානය වීමට මෙම විවාහ සම්බන්ධතා හේතු වී ඇති බව අනාවරණය කළ හැකි වේ.

විවාහයේ ස්වරූපයේ වෙනස් වීම හේතුවෙන් සාම්ප්‍රදායික විවාහයේ දී සලකා බලන ආරෝපිත සාධක ව්‍යුත්පන්න වී සාධිත සාධක කේන්ද්‍රගත වී ඇති බව අනාවරණය කළ හැකි ය.

කුටුම්බයෙහි අන්තර් සම්බන්ධතා, සංශක්තිය හා අනුකලනය වර්ධනය වීම සඳහා සාමාජිකයන්ගේ ඒකාබද්ධතාව අත්‍යවශ්‍ය වේ. අධ්‍යයන ප්‍රදේශයේ අලි - මිනිස් ගැටුම පාදක සාධකය බවට පත් වී කුටුම්බ අන්තර් සම්බන්ධතාව බිඳ වැටී ඇති බව අනාවරණය විය. ආරක්ෂණ යාන්ත්‍රණය බිඳ වැටීම තත්ත්වාකාර සාධකය ලෙස හඳුනා ගත හැකි ය. කුටුම්බ ගෘහ මූලිකයා හා වැඩිමහල් පිරිමි දරුවන් රාත්‍රී කාලයෙහි වගා ආරක්ෂා කිරීම සඳහා පැල් රැකීම, දෛනික කාලයෙන් වැඩි කාලයක් කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදවීම හේතුවෙන් අන්තර් සම්බන්ධතා බිඳ වැටීමට හේතු වී ඇති බව අනාවරණය විය. එය අධ්‍යයන නියැදියට අනුව 16%ක් වේ. එමෙන් ම ස්නේහය, ආදරය වැනි චිත්තවේගීමය අන්තර් සම්බන්ධතා බිඳ වැටීම හේතුවෙන් කුටුම්බ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාමේ ගැටලු පැන නැගී ඇත.

### 4. සංවර්ධන ව්‍යාපෘතිකරණය, ග්‍රාමීය පරිසරය හා ප්‍රජාව බාහිර සමාජයට විවෘත වීම

සංවර්ධන ව්‍යාපෘතිකරණය ග්‍රාමීය සමාජය තුළ ක්‍රියාත්මක වීමත් එහි ප්‍රතිලාභ ප්‍රජාවගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික අන්තර් සම්බන්ධතා සමෝදානය කිරීමේ මූලික උපාය මාර්ගක් වේ. සමාජ අනුකලනය හා සමූහ සංශක්තිය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රජා කණ්ඩායම් ග්‍රාමීය සමාජය තුළින් බිහිකිරීමත් එම සමාජ කණ්ඩායම් ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය සමග අනුගත කිරීම සඳහා අවශ්‍ය සක්‍යතාවය සමාජගත කිරීමත් ග්‍රාමීය දුරිදතාවය සඳහා සාධනීය වෛකල්පිත ක්‍රමවේදයක් සකස් කිරීම සංවර්ධන ව්‍යාපෘතිකරණය තුළින් අපේක්ෂිත සාධනීය කාර්යභාරයක් වේ. ඒ අනුව තෝරා ගත් ගම්මාන දෙකෙහි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ ස්වභාවය හා එය ගැටුම සමග අන්තර් සම්බන්ධතාවයක් නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳව අනාවරණය කර ගැනීම සිදුවිය. මෙම සංවර්ධන ව්‍යාපෘති හා ගැටුමේ නිලීන සාධක දික්ගැස්සුණු සමාජ ගැටුමක් දක්වා නිර්මාණය වී ඇති ආකාරය පහත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම තුළින් සනාථ කළ හැකිවේ.

**හම්බෙගමුව**

විධිමත් සංවර්ධන ව්‍යාපෘතිකරණයක් ග්‍රාමය තුළ ක්‍රියාත්මක වී නොමැති අතර 2005 වර්ෂයෙන් පසුව බලයට පත්වන ආණ්ඩුව **"එකගමට එක වැඩසටහනක්"** යටතේ අතුරු මාර්ග කොන්ක්‍රීට් කිරීම, ඇල මාර්ග පිළිසකර කිරීම සිදු කර ඇත. භෞතික පහසුකම් ග්‍රාමීය යටිතල පහසුකම් ඉලක්ක කර ගත් වැඩසටහනක් ලෙස මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වී ඇති අතර ප්‍රජා සංවර්ධන ක්‍රියාදාමයන් ශක්තිමත් කිරීමට අවශ්‍ය පහසුකම් සපයා ඇති බව අනාවරණය විය. එමෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ කුටුම්බ සුබසාධනය සංවර්ධනය කිරීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස වනජීවී දෙපාර්තමේන්තුව විසින් **"ජනවිහිදුම්කරණ වැඩසටහන"** ක්‍රියාත්මක කර ඇත. අඩු ආදායම්ලාභීන් ප්‍රජාව මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු හඳුනාගනිමින් එම ගැටලු සඳහා විසඳුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රජා සජීවීකාරක වැඩසටහනක් ලෙස ජනවිහිදුම්කරණ වැඩසටහන ක්‍රියාත්මක වී ඇත. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් හඳුන්වා දීම, එම ණය වැඩසටහන් කේන්ද්‍රකර ගනිමින් පවුල් සුබසාධනය මෙන්ම ප්‍රජා සංවර්ධන සක්‍යතා වැඩසටහනක් ලෙස අලි-මිනිස් ගැටුම විසඳීමට විදුලි වැට ඉදිකිරීම මුඛ්‍ය කාර්යභාරය විය. ග්‍රාමීය පවුල් ඒකාබද්ධ කරමින් ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මගින් ග්‍රාමීය ප්‍රජාව තුළ සමූහ සංශක්තිය හා ඒකාබද්ධතාවය ඇති කිරීමට කටයුතු කළ අතර ග්‍රාමීය ප්‍රජා නායකත්වයේ හෙමොනික් බලය ක්‍රියාත්මක වීමේ ධුරාවලිය නිසා සංවර්ධන වැඩසටහනක් ලෙස ජනවිහිදුම්කරණ වැඩසටහන අසාර්ථක විය. විශේෂයෙන්ම අලිවැට ඉදිකිරීම මගින් ප්‍රජාවගේ කෘෂි කාර්මික ජීවනෝපාය සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගනු ලැබුවත් ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නියාමන කාර්යභාරය ග්‍රාමීය දේශපාලනීකරණය වීම නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත කාර්යභාරය ඉටු නොවී ඇත.

**රාමු අංක 04**

**කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා අංක 02-, විවිධ රැකියාවන්හි නියුක්ත ප්‍රජාව, හම්බෙගමුව**

*" අපේ ගම්මානයට ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ආවේ ජනවිහිදුම්කරණ වැඩසටහන විතරයි. ඒ වැඩසටහන මගින් අපේ ගමේ අඩු ආදායම්ලාභී පවුල් නගා සිටුවන්න ක්ෂණික ණය යෝජනා ක්‍රම ඇති කරා. ඒ වැඩසටහනෙන් බලාපොරොත්තු වුණේ දුප්පත් පවුල් නගා සිටුවන්න. ඒ වගේම අපේ ගමේ ප්‍රධාන ප්‍රශ්නයක් වෙච්ච අලි ප්‍රශ්නයටත් මෙම වැඩසටහනෙන් අලි වැට ඉදි කරන්න කටයුතු කරා. ඒත් ඒ* වැඩසටහන හරියට ගමේ ක්‍රියාත්මක වුණේ නැහැ.ගමේ ඉන්න දේශපාලකයොයි, රටේ දේශපාලකයනුයි මේ වැඩසටහන හරියට කරගෙන යන්න කටයුතු කළේ නැහැ. දේශපාලඥයින්ගේ උවමනාවට වැඩසටහන ක්‍රියාත්මක වුණ නිසා වැඩසටහනෙන් සාර්ථක ප්‍රතිඵල ගන්න බැරි වුණා. ඒ නිසා අපේ අලි ප්‍රශ්නය එහෙමම ගමේ ඉතිරි වුණා.

ග්‍රාමීය දේශපාලන බල ව්‍යුහය තුළ ප්‍රජා දේශපාලන බල කණ්ඩායම් නිර්මාණය වීමත් එම බල කණ්ඩායම් මෙහෙය වීම සඳහා ප්‍රාදේශීය දේශපාලන බල සමූහ නිර්මාණය වීමත් නිසා විදුලි වැට තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රජාවට ලැබී නොමැත. මෙම අසාර්ථකත්වය නිර්මාණය වනුයේ ගම තුළ ප්‍රධාන දේශපාලන මතවාදී කණ්ඩායම් දෙකක් හා ස්වාධීන මතධාරී කණ්ඩායමක් ගම තුළ නිර්මාණය වීමත් සමග ය. මතවාදී කණ්ඩායම් ගම මධ්‍යයේ පිහිටි නිවෙස්වල වාසය කිරීමත් එමනිසා අලි මිනිස් ගැටුමෙන් වැලකීමට අවස්ථාව උදා වී ඇත. නමුත් රක්ෂිතය ආසන්නයේ සිටින ප්‍රජාව වින්දිත ප්‍රජාවන් බවට පත්වී ඇති අතර එම වින්දිතයන් අතර ප්‍රාදේශීය දේශපාලනයන්ගේ අනුගාමිකයන් මතවාදයන් ගම තුළ ක්‍රියාත්මක කිරීම නිසා ගැටුම උත්සන්න වී ඇති බව දැක්විය හැකිය. විදුලි වැට ඉදිකිරීම සඳහා ක්‍රියාමාර්ගයන් ගනු ලැබුවත් එය යාවත් කාලීන කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍යකරන වැඩපිළිවෙලක් සකස් නොකිරීම නිසා ආන්තීය කණ්ඩායමක් බවට රක්ෂිතයට යාබද ජීවත්වන ප්‍රජාව පත් වී ඇති බව අනාවරණය කළ හැකිය. විශේෂයෙන්ම මෙම අධ්‍යයනය තුළ ගැටුමේ වින්දිතයන් බවට පත් වී ඇති ප්‍රධාන ස්ථර 3ක් හඳුනා ගත හැකිය.

1. ගැටුමේ කේන්ද්‍රීය වින්දිත ප්‍රජාව- රක්ෂිතය ආසන්නයේ සිටින ප්‍රජාව

2. අතරමැදි වින්දිත ප්‍රජාව- රක්ෂිතය හා ගමට යාබදව ජීවත්වන ප්‍රජාව

3. පරිධියේ ජීවත්වන වින්දිත ප්‍රජාව- ගම මධ්‍යයේ ජීවත්වන ප්‍රජාව

මෙවැනි ප්‍රධාන ස්ථර 3ක් හම්බෙගමුව ගම්මානය තුළ අනාවරණය කරගැනීමට හැකි වුවත් ගැටුම තුළ පරපෝෂිත කණ්ඩායමක් හඳුනා ගැනීමේ හැකියාව ලැබුණි. එම පරපෝෂිය කණ්ඩායම ද ප්‍රධාන ස්ථර 3ක් අනාවරණය කර ගැනීමට හැකි වූ අතර එක් ස්ථරයක් අනෙක් ස්ථරය ශක්තිමත් කිරීම සිදුවේ.

1. ප්‍රාදේශීය දේශපාලඥයින්ගේ අනුගාමික ප්‍රජා දේශපාලන නායකයන් (දේශපාලන කමිටු නායකයන්, ප්‍රජා කමිටු නායකයන්)

2. ප්‍රජා සංවර්ධන කමිටු නායකයන්

3. ගම තුළ ජීවත්වන රාජ්‍ය නිලධාරීන් (කෘෂි නිලධාරිවරයා, ග්‍රාමසේවක, ආර්ථික සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී)

**හම්බෙගමුව ජනපදය**

ගෝලීය සංවර්ධන ක්‍රමෝපායන් හා ග්‍රාමීය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් සංවර්ධන ව්‍යාපෘතිකරණයක් මෙම ග්‍රාමය තුළ ක්‍රියාත්මක වී ඇති අතර ස්වාභාවික සම්පත් ආකර්ශනය

ව්‍යාපෘති බිහිවීමේ කේන්ද්‍රීය සාධකයන් වී ඇති බව අනාවරණය කළ හැකිය. සංවර්ධන ව්‍යාපෘති බිහිවීමේ කේන්ද්‍රීය මූලාශ්‍ර බවට හම්බෙගමුව වැව හා ස්වභාවික ඉඩම් පිහිටීමේ රටාව ප්‍රමුඛ වී ඇත. ඒ අනුව ගම තුළ අනාවරණය කරගත් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් හඳුනා ගත හැකි වූ අතර එය පහත පරිදි දැක්විය හැකිය.

1. අභ්‍යන්තර සංවර්ධන ව්‍යාපෘති (ගම තුළ සිදු වූ සංවර්ධන ව්‍යාපෘති)

2. බාහිර සංවර්ධන ව්‍යාපෘති (බාහිර සමාජය තුළ සිදු වූ සංවර්ධන ව්‍යාපෘති)

සංවර්ධන ව්‍යාපෘතිකරණය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන සාධකයන් 2ක් ගම තුළ හඳුනා ගත හැකිවිය.

1. ඇදගැනීමේ සාධක (Push Factor)

2. තල්ලු කිරීමේ සාධක (Push Factor)

ඒ අනුව අභ්‍යන්තර සංවර්ධන ව්‍යාපෘති පහත පරිදි දැක්විය හැකිය.

1. හොටෙල් කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති

2. ව්‍යාපාරික කෘෂි කර්මාන්තය මත පදනම් වූ සංවර්ධන ව්‍යාපෘති

3. ගොම පොහොර සෑදීමේ සංවර්ධන ව්‍යාපෘති

හොටෙල් කර්මාන්තය ගම තුළ ස්ථාපිත වීම සඳහා හම්බෙගමුව වැවෙහි ස්වභාවික පිහිටීම කේන්ද්‍රීය සාධකයක් වී ඇති අතර වැව ඉස්මත්තෙහි ගොඩනැගිලි ඉදිකිරීමත් සංචාරක ආකර්ශනය වර්ධනය කර ගැනීමේ සාධකයන් ද ප්‍රමුඛ වී ඇති බව අනාවරණය විය. වැව කේන්ද්‍ර කර ගනිමින් ගම පිහිටා ඇති අතර වන රක්ෂිතය ද වැව ආසන්නයේ පිහිටා තිබීම නිසා සත්ව හානිය වර්ධනය වී ඇත. වැව ඉස්මත්ත තුළ ගොඩනැගිලි ඉදිකිරීමත් සත්වයන් සඳහා අවශ්‍ය පානීය ජලය සපයා ගැනීම සඳහා වැව භාවිත කිරීමට නොහැකිවීමත් නිසා ගැටුම ගම තුළ නිර්මාණය වී ඇත. විශේෂයෙන්ම 1995 කාලපරිච්ඡේදයෙන් පසුව වන රක්ෂිතය හා වැවෙහි පිහිටීම පිළිබඳව ජාතික දේශපාලනයේ අවධානය යොමුවීමත් සංචාරක ආකර්ශනය සඳහා ගමෙහි ස්වභාවික පිහිටීම ආර්ථික උත්පාදක කාර්යයට යොදා ගැනීමේ අවශ්‍යතාවය මත ගම තුළ බාහිරස්ථ සාධකයක් ලෙස හොටෙල් කර්මාන්තය ස්ථාපිත වීම සිදුවිය.

හොටෙල් කර්මාන්තය ආරම්භවීමට පෙර වැව් රක්ෂිතය සතුන්ගේ කායික අවශ්‍යතා සාධනය කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානය විය. ජල අවශ්‍යතා, ආහාර අවශ්‍යතා වැව හා රක්ෂිතය කේන්ද්‍රකර ගනිමින් සිදුවුවත් ඉදිකිරීම් කර්මාන්තය ගම තුළ ස්ථාපිත වීමත් සමග සත්ව ප්‍රජාවගේ කායික අවශ්‍යතා සඳහා බලපෑමක් සිදුවූ බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රජාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ අතර හොටෙල් කර්මාන්තය ආරම්භ වීම නිසා ඔවුන්ගේ ජීවනෝපායට ද බලපෑම් සිදු වී ඇත. රක්ෂිතය හොටෙල් කර්මාන්තයෙන් බැහැර කරන කසල වැවට මුදා හැරීම නිසා මත්ස්‍ය සම්පත විනාශ වීමත් වන සතුන් වැවෙහි ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වැවෙහි ප්‍රධාන සොරොව්ව බිඳදමා ඇති බවත් මේ නිසා ජීවනෝපායනට තර්ජනයත් වී ඇති බව අනාවරණය විය. රක්ෂිතයත් වැව් තාවුලත් අතර කලාපය වන සතුන්ගේ සංචරණ කලාපය වීමත් ඉදිකිරීම් කර්මාන්තය ස්ථාපිත කිරීමේ දී ශක්‍යතා අධ්‍යයනයන් සිදු නොකිරීමත් නිසා ගම තුළ ගැටුම සමාජගත වී ඇත.

| |
|---|
| **රාමු අංක 05**<br><br>**ප්‍රත්‍යයික අධ්‍යයන අංක03 -, චාමර, අවුරුදු 40, ධීවර කර්මාන්තය** |
| *ගමේ හොටෙල් කර්මාන්තය ආරම්භ කරලා තියෙන්නේ දේශපාලඥයින්ගේ උවමනාවට තමයි. කිසිම අධ්‍යයනයක්වත් පර්යේෂණයක්වත් කළේ නැහැ වැව ආශ්‍රිතව හොටෙල් ඉදිකරන කොට. සමහර හොටෙල්* |

*වැවු තාවුලේ වගේම අලි ගමන් කරන මාර්ග හරස්කරලා තමයි හදලා තියෙන්නේ. ඒවා සියල්ලම පරිසර සංරක්ෂණ එකෙනුයි ඉදිකිරීම් එකෙනුයි අනුමත කරලා තියෙන්නේ දේශපාලන හයිය මත. ගමේ අපිට මේ මේ වගේ ඉදිකිරීමක් කලාම වන ගැටුල බලලා නැහැ. ගම තනිකරම දේශපාලන හෙංචයියින්ගේ උවමනාවට තමයි හැඩල් කරන්නේ*

වානිජ කෘෂි කර්මාන්තය ගම තුළ ස්ථාපිත වීම සඳහා රජයේ 99 බදු ප්‍රතිපත්තිය හා මහා පරිමාන ඉඩම් විකිණීම මුලික සාධකයක් විය. විශේෂයෙන්ම රක්ෂිත ඉඩම් කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමේ ක්‍රමෝපායන් ලෙස භාවිත කිරීමත් රක්ෂිත ලාභය නැමති සංකල්පය සමග කේන්ද්‍රගත කිරීමත් ලාභයේ ප්‍රතිලාභ බල කණ්ඩායම් වටා සංකේන්ද්‍රණය වීම දික්ගැස්සුණු සමාජ ගැටුමක ලක්ෂණයන් වී තිබේ. මහා පරිමාන ස්වදේශීක හා විදේශික ව්‍යාපාරිකයන්ගේ ලාභ උපයන මධ්‍යස්ථානයක් බවට ගම පත්ව ඇති අතර භූමියේ පිහිටීම, සස්ශ්‍රීකත්වය යන සාධක ව්‍යාපාරික කෘෂි කර්මාන්තය සඳහා තල්ලු කිරීමේ සාධක වී ඇති බව අනාවරණය විය. කෘෂි ඉඩම් මංකොල්ලකරණයක් ගම තුළ ක්‍රියාත්මක වන අතර ඉඩම් මංකොල්ලකරණයේ දී ප්‍රජා හා ග්‍රාමීය බල කණ්ඩායම් ධුරාවලීගත වීමත් හඳුනා ගත හැකිය. ධුරාවලීගත වීමේ දී රක්ෂිතය සඳහා ඉඩම් බදු පනත් ක්‍රියාත්මක වීමත් ප්‍රජාවගේ කෘෂි ඉඩම් බලපත්‍ර බලහත්කාරයෙන් පවරා ගැනීම සිදුවී ඇති අතර පරිසර සාධකයන් ද නොසලකා ඇත. කෘෂි ඉඩම් පවරා ගැනීමත් සමග ව්‍යාපාරික ප්‍රජාව පෞද්ගලික වියදමෙන් ඉඩම් වටා ආරක්ෂිත විදුලි වැට ඉදිකර ගැනීම සිදු වී ඇත. මේ නිසා රක්ෂිතය තුළ සත්ව ප්‍රජාවගේ ආහාර සපයා ගැනීමේ ස්ථාන අහිමිවීමත් ඔවුන්ගේ වාසස්ථාන අහිමිවීමත් නිසා අලි-මිනිස් ගැටුම ගම තුළ වර්ධනය වී ඇති බව අනාවරණය කළ හැකිය.

පලතුරු, එළවළු, පොල් හා වටිනා කාය ගස් වානිජ බෝගවේදී ප්‍රමුඛ වී ඇත. වානිජ බෝග ආර්ථිකය ගම තුළ ස්ථාපිත වීමත් කෘෂි බෝග ආරක්ෂා කිරීම සඳහා තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කිරීම නිසා ආර්ථික වින්දිතයන් බවට ග්‍රාමීය ප්‍රජාව පත් වී ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රජාව කෘෂි කර්මාන්තය ශ්‍රමය මත පදනම් වු ක්‍රමෝපායන් භාවිත කිරීම සිදුවන අතර ශ්‍රම සාධකය ඵලදායී ලෙස භාවිත කිරීමට නොහැකි වුවහොත් කෘෂි කර්මාන්තයෙන් අපේක්ෂිත ලාභය ලබා ගැනීමේ හැකියාව නොමැති වී තිබේ. ඒ අනුව තාක්ෂණික හා ශ්‍රම සාධකය අතර පරතරයක් නිර්මාණය වීම අලි-මිනිස් ගැටුමේ ප්‍රකට සාධකයක් වේ. තාක්ෂණික අලි වැට ඉදිකිරීම නිසා මෙගා ව්‍යාපාරික ප්‍රජාවගේ කෘෂි කර්මාන්තය ආරක්ෂා වීමත් වන සතුන් ග්‍රාමීය වින්දිත ප්‍රජාවගේ කෘෂි කාර්මික වගාවන් සඳහා ප්‍රවේශ වීමත් මෙහි අර්ථය වේ. කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය ශ්‍රම සම්පත ගම තුළ ස්ථාපිත වීමත් වේතන ලබන වැටුප් හිමි කණ්ඩායමක් නිර්මාණය වී තිබීම නිසා වානිජ කෘෂි ආර්ථිකය අනුවර්තනීය වෙනසියාවක් ඇති කිරීමට පුර්වෝක්ත සාධක වී ඇත.

වන රක්ෂිතය තුළ අක්කර 2000කට වැඩි භූමි ප්‍රමාණයක් ගොම පොහොර ව්‍යාපෘතිය සඳහා භාවිතය ගෙන ඇති අතර ඉඩම් භුක්තියේ ස්වභාවය ගැටුමේ ඍජු සාධකයන් වී ඇත. ව්‍යාපෘතිය ගම තුළ ක්‍රියාත්මක වීමත් සමග වන සතුන්ගේ ආහාර, ජල අවශ්‍යතා අහිමිවීම නිසා වින්දිත ප්‍රජාවක් බවට ෂත්ව ප්‍රජාව පත්ව තිබේ. විශේෂයෙන්ම පොහොර ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමග පාරිසරික සම්පත් ක්ෂය වීමත්, මානවයාගේ දෛනික අවශ්‍යතා සඳහා සපුරා ගැනීම සඳහා වන සම්පත ප්‍රයෝජනයට ගැනීම අහිමිවීමත් නිසා වින්දිත කණ්ඩායමක් බවට මානව ප්‍රජාව ද පත්ව ඇති බව අනාවරණය විය.

බාහිර සමාජය තුළ සිදුවු විවිධ සංවර්ධන ව්‍යාපෘති අධ්‍යයන ප්‍රදේශය තුළ මානව හා සත්ව ගැටුම වර්ධනය වීම සඳහා හේතු වී ඇත. ආබද්ධ සංවර්ධන ව්‍යාපෘති ලෙස පර්යේෂකයා විසින් එය හඳුනා ගනු ලබන අතර එම ආබද්ධ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයේ පරිසර හා ග්‍රාමීය සමාජ තුල්‍යතාවය බිඳවැටීමට හේතු වී ඇති බව අනාවරණය කළ හැකිය. මත්තල ගුවන් තොටුපල, මහින්ද රාජපක්ෂ අන්තර් ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය, හම්බන්තොට වරාය හා හම්බන්තොට මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාව යන බාහිරස්ථ මෙගා සංවර්ධන ව්‍යාපෘති සමග අධ්‍යයන ප්‍රදේශය තුළ ගැටුම සමාජගත වීමක් දැකිය හැකිය. බාහිරස්ථ සමාජය තුළ ඇති වු මෙගා සංවර්ධන ව්‍යාපෘති හා

ඉදිකිරීම් කර්මාන්තය නිසා පාරිසරික සම්පත විනාශ වීම, සතුන්ගේ නිජ බිම් ආක්‍රමණය කිරීම හා නව නිජ බිම් සොයා සංචරණය කිරීම යන කාරණා ගැටුම තුළ ප්‍රකට කාරණයන් වී ඇත. මේනිසා නව නිජබිම්කරණය මත අලි සනත්වය වර්ධනය වීම, ආහාර අවශ්‍යතා සඳහා තරගයක් නිර්මාණය වීම යන නිලීන කාරණයන් ද ගැටුමේ අනාවරිත සාධකයෝ වෙති.

සංවර්ධන ව්‍යාපෘතිකරණය හම්බෙගමුව ජනපද ග්‍රාමය තුළ ක්‍රියාත්මක වීමේ ස්වභාවය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන ස්ථර තුනක් හඳුනා ගත හැකිය.

1. මහා පරිමාන වෙළඳ ප්‍රජා කණ්ඩායම

2. ව්‍යාපෘතිකරණයෙන් යැපුම්ලාභී ස්ථරය- සංවර්ධන ව්‍යාපෘතිකරණයෙන් සෘජුව ප්‍රතිලාභ භුක්තිවිදින ප්‍රජාව(හොටෙල් කර්මාන්තයේ හා අනෙක් සංවර්ධන ව්‍යාපෘතිවල ශ්‍රම දායකත්වය සපයන ප්‍රජාව)

3. රේඛීය වින්දිත ප්‍රජාව- සංවර්ධන ව්‍යාපෘතිකරණයෙන් සෘජුව වින්දිතයන් වී ඇති ප්‍රජාව

**නිගමන හා අනාවරණ**

මෙම අධ්‍යයන තේමා පහක් යටතේ විශ්ලේෂණය කිරීම සිදුකළ අතර එම විශ්ලේෂිත දත්තයන් අනුව අලිමිනිස් ගැටුම අධ්‍යයන ප්‍රදේශය තුළ දික්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත් වී ඇති බව අනාවරණය කළ හැකිය. ගැටුම තුළ ප්‍රකට කාරණයන් සහවේදීය දෘෂ්ඨියකින් අනාවරණය වුවත් ගැටුමේ පූර්වෝක්ති සාධක හා දේශීය කෘෂිකර්මාන්තය ව්‍යාපාරික කෘෂිකර්මාන්තයක් බවට පත්වීමත් ග්‍රාමීය අංශය තුළ තරගකාරීත්වය ආර්ථික සාධකය සමග ආකලිතවීම ප්‍රතිවාදික දෘෂ්ටියකින් හඳුනා ගත හැකිය. ගැටුමේ ප්‍රතිලාභ කුටුම්භ ක්‍රියාකාරීත්වයේ ප්‍රාථමික, ද්විතීක අවශ්‍යතා පූරණය සඳහා ප්‍රතිජානාත්මක සම්බන්ධතාවයක් නිර්මාණය කර ඇති අතර සාධිත තත්ත්වය තුළ අනාගත භූමිකා බිඳවැටීමට හේතු වී ඇත. බල ව්‍යුහීය ආකෘතිය තුළ ධුරාවලීගත බල ව්‍යුහීය ආකෘතිය හා ඡායා බල ආකෘතිය අදෘෂ්ෂමාන හස්තයක් ලෙෂ ග්‍රාමීය සමාජය තුළ ක්‍රියාත්මක වී ඇති අතර එම ක්‍රියාත්මකභාවයේ ස්වභාවය ගැටුමට මුහුණ දෙන පාර්ශවයේ සමාජ, ආර්ථික හා සංස්කෘතික ජනජීවිතය අකර්මණ්‍ය බවට පත් කිරීමට හේතු සාධක වී ඇත. විශේෂයෙන්ම සාර්ව හා සූක්ෂම බල ව්‍යුහය සමග මධ්‍ය හා බාහිරස්ථ බල ව්‍යුහය ආකලිත වී තිබීමත් සාර්ව හා සූක්ෂම බල ව්‍යුහය සමස්ත බල පද්ධතිය මෙහෙය වන හස්තයක් බවට පත්වීම ගැටුමේ සාධකයන් තීවර කිරීමට හේතු සාධකයන් වේ. ග්‍රාමීය පාරිසරික පද්ධතිය ධනෝපායන මාර්ගයක් වීමත් එම ධනෝපායන මාර්ගයන්හි යැපෙන පරපෝෂීය ප්‍රජා කණ්ඩායමක් ගම තුළ නිර්මාණය වීම ගැටුමේ බල ව්‍යුහීය සාධක හා සංරචක ශක්තිමත් කිරීමක් වේ. මේනිසා ගැටුම තුළ ප්‍රජාව වින්දිතයන් බවට පත් වී ඇත්තේ ග්‍රාමීය පරපෝෂිතයන්ගේ ක්‍රියාකලාපය හා බාහිර දේශපාල බල ව්‍යුහීයන්ගේ හෙජමොනික් සාධක නිසා බව ගැටුමේ ගැඹුරු සාධක තුළින් අනාවරණය වේ. මේනිසා බල ව්‍යුහීය ආකෘතිය තුළ ප්‍රජාවන්ගේ දුක්ගැනවිලි සාධක හා ලාභය උපරිම කර ගැනීමේ සාධක අන්තර්ගත වී ඇති බව දැක්විය හැකිය. මේනිසා කේන්ද්‍රය හෙවත් ජාතික දේශපාලනය හා ප්‍රතිපත්තිවල සංකීර්ණතාවයත් නිලධාරීකරණය විසින් දේශපාලන අධිකාරීමය තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාවලිය ගැටුමට මුහුණ දෙන පාර්ශවයේ වින්දිතභාවය වර්ධනය කිරීමට හේතු වී ඇත. එය පුද්ගලයා, පවුල, ප්‍රජාව හා සමාජය බලගැන්වීමේ කාර්ය සඳහා ප්‍රවේශ සාධකයන් වේ. මෙම උභතෝකෝටික කාරණා දේශපාලන සහජාතීයකරණයක සිට විෂම ජාතීයකරණයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාදාමය සකස් කර ඇති බව පෙනේ. දේශපාලන බල ව්‍යුහීය ආකෘතිය ග්‍රාමීය සමාජය තුළ බලමුළුගැන්වීමත් එම බලමුළුගැන්වීම මානව කුටුම්බය තුළ සුබසාධන ක්‍රියාවලිය බිඳවැටීමටත් පරිපෝෂිත කණ්ඩායමක් ග්‍රාමීය පරිසරය තුළ නිර්මාණය වීමට අවශ්‍ය අවකාශීය පසුබිම ගොඩනැගී තිබීමත් නිසා ගැටුම දික්ගැස්සුණු සමාජ ගැටුමක් බවට විපරිවර්තනය වී ඇති බව නිගමනය කළ හැකිය. මේනිසා ගැටුම වැලැක්වීමට වඩා සමථන කාර්යක් තුළින් විසඳුම් ක්‍රියාවලියකට යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කළ යුතු වේ.

**ආශ්‍රේය ග්‍රන්ථනාමාවලිය**


අබේගුණවර්ධන, පි., සේනාරත්න, ඒ. (2002). *ස්වභාවික සම්පත් හා පරිසර ආර්ථික විද්‍යාව.* කැස්බෑවඃ ඉමදුවගේ ක්‍රියේෂණ්.

ආරියදාස, ඩී. (2002). *මිනිසා සහ පරිසරය.* මහරගමඃ තරංජී ප්‍රින්ටර්ස්.

ආරියසේන, එස්. (2004). *ගෝලීයකරණය සොබාදහම සහ මානව සංහතියේ ඉරණම.* කර්තෘ ප්‍රකාශනයකි.

කරුණාදාස, ඩබ්.එම්. (2003).*ගැටුම් නිරාකරණයට හැඳින්වීමක් .* දෙහිවලඃ ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.

කරුණාරත්න. එච්.කේ.එන්. (2011) .'ශ්‍රී ලංකාවේ මිනිස් වල් අලි ගැටුම ක්ෂේත්‍රීය රටාව සාධක සහ විසඳුම්' In*: Parliamentary Research Journal*. Sri Jayawardanapura: Parliament of Sri Lanka

ගුණසේකර, යු. (2011 අගෝස්තු). මානුෂීය මෙහෙයුමකින් අලි මිනිස් ගැටුම විසඳමු. *විදුසර.* කොළඹඃ උපාලි පුවත්පත් සමාගම.

ගුණරත්න, එල්. එච්. පී., (2009). *අලි- මිනිස් ගැටුම හා ග්‍රාමීය දරිද්‍රතාවය.* කොළඹඃ කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානය

ජයකොඩි, එස්. කේ. (2007). *තිරසාර සංවර්ධනයඃ සංකල්පනාත්මක න්‍යාය සහ ව්‍යාහාරිකත්වය.* කැළණියඃ කැළණිය විශ්වවිද්‍යාලය.

ද සිල්වා, ඒ. (2001). *සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේදය.* කතෘ ප්‍රකාශන.

ද සිල්වා, පී. කේ. (2010). *ශ්‍රී ලංකාවේ වල් අලීන්ගේ අද තත්ත්වය, අලි සංරක්ෂණය සහ මිනිස් අලි ගැටුම ඌනනය කිරීම.* පේරාදෙණිය විශ්වවිද්‍යාලයඃ සත්වවිද්‍යා අධ්‍යයනාංශය.

ධනපාල, ඒ. එච්. (2006). *පාරිසරික භූගෝල විද්‍යාව, පරිසර දූෂණය හා ජෛව විවිධත්වය.*මහරගමඃ තරංජී ප්‍රින්ටර්ස්.

ප්‍රනාන්දු, ඩබ්. එම්. (2005). *පුද්ගල ගැටුම් සමථකරණයට ක්‍රියාවලිය.* වරකපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

*මහබැංකු වාර්ෂික වාර්තාව.* (2019). කොළඹඃ මහබැංකු වාර්ෂික ප්‍රකාශනයකි.

විතාරණ, ටි., චන්ද්‍රසේකර, කේ. (2012). *ගැටුම් නිරාකරණය.* කොළඹඃ සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ.

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය (2019). *සම්පත් පැතිකඩ වාර්තාව.* තණමල්විලඃ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

සමරකොන්, ගාමිණී විජිත්. (2010). ශ්‍රී ලංකාවේ වන- අලි මිනිස් ගැටුමඃ අතීත හා වර්තමාන ප්‍රවනතා. *වනජීවී සගරාව.* පිටු අංක 7-12. බත්තරමුල්ලඃ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

හෙට්ටිආරච්චි, ජේ. (2000). *පාරිසරික භූගෝල විද්‍යාව(පරිසරයේ මූලික මූලිකාංග).* කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Azar, E. (1990). *The Management of Protracted Social Conflict: Theory and Cases*.Aldershor: Dratmouth.

Babbie, E. (2004). *The Practice of Social Research*.(10th Ed). Belmont: Wardsworth /Thomson Lerning.

Bandara, R. (2002a). *Willingness to pay for Conservation of the Asian Elephant in Sri Lanka: A Contingent Valuation Study*. Research gate.net.

Bandara. R. (2005b). *The Economics of Human-Elephant Conflict*. Battaramulla: Ministry of Environmental and Natural Resource.

Boulding, K. (1962). *Conflict and Defence: A General Theory*.New York: Oxford University Press.

Chambers, R. (1983). *Rural Development: Putting the Last First*. Longman: Haslow.

Croze,H., Hillman,A.K. & Lang, E.M. (1981).Elephants and their habitats: How do they tolerate each other. In: *Dynamics of Large Mammal Populations*. (Eds). New York: John Wiley & sons.

Cunnigham, P., William, T., & Saigo., B. (1993). *Environment Science*. A Giddle Concern: WCD Publication.

Craves, J., Reavey, D. (1996). *Globle Environment Change*.Longman: Sage Publication.

Department of wildlife conversations, (2020). National elephant conservation policy. Retrieved From http://203.143.23.34/index.php/policies-a-legislations/national-elephantconservation-policy.html?showall=1, (Accessed 2023/04/28).

Dharmaratne, M. P. J., & Magedaragamage, P. C. (2014). *Human elephant conflict and solutions to it in Sri Lanka*. Sciscitator, 1, 56-58. https://doi.org/10.1037/edu0000396

Ekanayaka, S. K. K., A. et al., (2011). Patterns of Crop Raiding by Asian Elephants in a Human-Dominated Landscape in Southeastern Sri Lanka. *Gajah* 34: 20–25.

Fernando, P. et al., (2011). *Current Status of Asian Elephants in Sri Lanka*. Gajah 35, pp. 93-103.

*Fernando,P.(2000). Elephant in Sri Lanka: Past, Present and Future. Loris 22: 38-44*.

Fernando, P., Jayewardene, J. Prasad, T. Hendavitharana, W. & Pastorini, J. (2011). Current status of Asian elephants in Sri Lanka. *Gajah* 35: 93–103.

Galtung, J. (1975). *A Structural Theory of Aggression. Journal of Pease Research* (Volume 01). Copenhangen: Christian EJ lers.

Gamage. D. and Aheeyar. A., (1998). *Economic and Social factors affecting land degradation in the Upper Mahaweli Catchment. Sri Lanka*: Environmental Action Project by Ministry of Forestry and Environmental

Gunawardhana, L.M.A.P., & Herath, N.S.K. (2018). *An analysis of human – elephant conflict of disaster. A case study in Anuradhapura district of Sri Lanka*. .https://www.researchgate.net/publication/328359673

Gunarathne, L.H.P., & Premarathne, P.K., (2005). *The effectiveness of electric fencing in mitigation human-elephant conflict in Sri Lanka*. Research Report No, 2011-RR11. Economy and Environment Program for Southeast Asia.

International Research Institute for Climate and Society. (2005). *Climate Influences on Human Elephant Conflict in Sri Lanka.* US: Columbia University

Ishwaran, N. (1993). Ecology of the Asian Elephant in lowland dry zone habitats of the Mahaweli river basin. Sri Lanka. J. Trop. Ecol. 9; 169-182.

Jayawardane.J. (1993). Elephant Management and Conservation in the Mahawili Project areas.*Gajah* 11; 6-15.

Lahiri, Choudhury, D.K. (1991). Keeping wild Elephants at bay. In. *The Illustrated encyclopedia of Elephants(ed)*. S.K. Eltringham.166-173. London: Salamander Books.

Maxwell, J. A. (1996). *Qualitative Research Design*. Thousand Oaks. CA; Sage Publication.

Nelson, A., Bidwell, P., & Sillero-Zubiri, C., (2003). A Review of Human elephant conflict Management Strategies. People and Wildlife Initiative. Wildlife Conservation Research Unit, Oxford University. www.peopleandwildlife. org.uk/crmanuals /HumanElephantConflictP&W Manual. Accessed on the 7th May, 2023

Perera, B., Oswin. M. A. (2009). The Human-Elephant Conflict: A Review of Current Status and Mitigation Methods. *Gajah* 30: 41–52.

Punchihewa,G.S.S.(1989). *Souvenirs of a forgotten heritage*. Government press. Colombo: Desathiya Publications.

Pruitt, D., and Rubin, J. (1986). *Social Conflict: Escalation, Stalemate and Settlement*. New York: Random Houses.

Santiapillai, C., Wijeyamohan, S., Bandara, G., Athurupana, R., Dissanayake, N., & Read, B. (2010). An assessment of the human-elephant conflict in Sri Lanka. *Ceylon Journal of Science* (Biological Sciences). 39(1):21-23. https://doi.org/10.4038/cjsbs.v39i1.2350

Santiapillai, C. (1996). *Mitigation of Human conflict in Sri Lanka.* https://pubs.iied.org/sites/default/files/pdfs/migrate

Sukumar, R. (1989). *The Asian Elephant; Ecology and Management*. Cambridge University Press. Cambridge. UK.

Watson, R.M. & Bell, R.H.V. (1969). The distribution, abundance and status of elephant in the Serengeti region of Northern Tanzania. *J. Applied Ecology*. 6: 115-132.

Wikramanayake, E.D., Dinerstein,E., Robinson, J.G., Karanth, U., Rabinowitz,A., Olson, D., Matthew,T., Hedao, P., Conner,M., Hemley,G. & Bolze,D., (1998). *An Ecology –based method for defining Priorities for large Mammal Conservation*: Bio1. 12: 865-878.